(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 3(14).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2026 ජුනි 12 සිකුරාදා**

---

**2026 ජුනි 23 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මාර්තු 31 දිනැති අංක 2482/09 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මැයි 04 දිනැති අංක 2487/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 මැයි 07 දිනැති අංක 2487/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.09 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියමය,— 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 1(2) වගන්තිය යටතේ එවකට බලශක්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මාර්තු 05 දිනැති අංක 2478/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පුරාවස්තු ආඥාපනත යටතේ නියෝග,— (188 අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 46 වගන්තිය සමඟ කියවිය යුතු 47 වගන්තිය යටතේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් 2026 අප්‍රේල් 11 දින සාදන ලදුව, 2026 ජුනි 12 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 ජුනි 24 බදාදා)**

887/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී එරාවූර්පත්තු, වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අයදුම් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එරාවූර්පත්තු, වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචිවී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

888/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019.01.01 සිට 2025.03.31 දක්වා එරාවුර්පත්තු, වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(ii) පැවති රජයේ විශේෂ වැඩසටහනක් යටතේ එම පුද්ගලයන්ට 'උරුමය' සින්නක්කර ඔප්පු ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iv) 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද ඉහත පුද්ගලයන් අතරින් ඇතැම් පුද්ගලයන්ට එම ඔප්පු ලබාදී නොමැති බව දන්නේද:

(v) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) ඔවුන්ට මේ දක්වා 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

889/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් පිරිනමනු ලබන 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' නොමැතිව මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවුර්පත්තු, වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පුද්ගලයන් පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයින්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම රජයේ ඉඩම්වලින් ඉහත පුද්ගලයන් නීත්‍යානුකූලව ඉවත් කිරීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඔවුන්ට එරෙහිව අධිකරණයේ නඩු පවරා තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(v) අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු පැවරූ පුද්ගලයන් අතරින් ඉහත කාලසීමාවේදී අධිකරණ නියෝග මත රජයේ ඉඩම්වලින් ඉවත්කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(vi) නඩු පැවරිය යුතු එහෙත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු නොපවරන ලද පුද්ගලයන් සිටීද;

(vii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(viii) කිහිපදෙනෙකුට එරෙහිව පමණක් නඩු පැවරීමටත්, වැඩි පිරිසකට එරෙහිව නඩු නොපැවරීමටත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2058/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සිට 2025 දක්වා එක් එක් වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ —

(i) වාර්තාවී ඇති දරු උපත් සංඛ්‍යාව;

(ii) දරු උපත් සංඛ්‍යාවේ අඩුවීම එක් එක් වර්ෂයට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ දරු උපත් සංඛ්‍යාව අඛණ්ඩව පහළ යාමට හඳුනාගෙන ඇති හේතු කවරේද;

(ii) දරු උපත් සංඛ්‍යාව පවත්වාගෙන යායුතු ප්‍රශස්ත අගය කොපමණද;

(iii) දරු උපත් සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා දරුවන් අපේක්ෂා කරන පවුල් වෙත යම් සහන හෝ වරප්‍රසාද ලබාදීමට අපේක්ෂා කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 ජුනි 25 බ්‍රහස්පතින්දා)**

890/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කොරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31 දක්වා කාලවකවානුව තුළ රජයේ 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' ලබා දුන් ඉඩම්වල ජනතාව පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

891/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අයදුම් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචිවී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

892/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019.01.01 සිට 2025.03.31 දක්වා කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(ii) පැවති රජයේ විශේෂ වැඩසටහනක් යටතේ එම පුද්ගලයන්ට 'උරුමය' සින්නක්කර ඔප්පු ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iv) 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද ඉහත පුද්ගලයන් අතරින් ඇතැම් පුද්ගලයන්ට එම ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(v) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) ඔවුන්ට මේ දක්වා 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 ජුනි 26 සිකුරාදා)**

893/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් පිරිනමනු ලබන 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' නොමැතිව මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පුද්ගලයන් පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයින්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම රජයේ ඉඩම්වලින් ඉහත පුද්ගලයන් නීත්‍යානුකූලව ඉවත් කිරීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඔවුන්ට එරෙහිව අධිකරණයේ නඩු පවරා තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(v) අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු පැවරූ පුද්ගලයන් අතරින් ඉහත කාලසීමාවේදී අධිකරණ නියෝග මත රජයේ ඉඩම්වලින් ඉවත්කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(vi) නඩු පැවරිය යුතු එහෙත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු නොපවරන ලද පුද්ගලයන් සිටීද;

(vii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(viii) කිහිපදෙනෙකුට එරෙහිව පමණක් නඩු පැවරීමටත්, වැඩි පිරිසකට එරෙහිව නඩු නොපැවරීමටත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

894/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කොරළේපත්තු දකුණ, කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31 දක්වා කාලවකවානුව තුළ රජයේ 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' ලබා දුන් ඉඩම්වල ජනතාව පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

895/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී කෝරළේපත්තු දකුණ, කිරාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අයදුම් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කෝරළේපත්තු දකුණ, කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචිවී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 ජූලි 07 අඟහරුවාදා)**

896/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019.01.01 සිට 2025.03.31 දක්වා කෝරළේපත්තු දකුණ, කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(ii) පැවති රජයේ විශේෂ වැඩසටහනක් යටතේ එම පුද්ගලයන්ට 'උරුමය' සින්නක්කර ඔප්පු ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iv) 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද ඉහත පුද්ගලයන් අතරින් ඇතැම් පුද්ගලයන්ට එම ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(v) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) ඔවුන්ට මේ දක්වා 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

897/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් පිරිනමනු ලබන 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' නොමැතිව මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළේපත්තු දකුණ, කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පුද්ගලයන් පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයින්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම රජයේ ඉඩම්වලින් ඉහත පුද්ගලයන් නීත්‍යානුකූලව ඉවත් කිරීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඔවුන්ට එරෙහිව අධිකරණයේ නඩු පවරා තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(v) අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු පැවරූ පුද්ගලයන් අතරින් ඉහත කාලසීමාවේදී අධිකරණ නියෝග මත රජයේ ඉඩම්වලින් ඉවත්කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(vi) නඩු පැවරිය යුතු එහෙත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු නොපවරන ලද පුද්ගලයන් සිටීද;

(vii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(viii) කිහිපදෙනෙකුට එරෙහිව පමණක් නඩු පැවරීමටත්, වැඩි පිරිසකට එරෙහිව නඩු නොපැවරීමටත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 ජූලි 10 සිකුරාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 4/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යා පීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දියුණු ජාත්‍යන්තර තලයට ගෙන යාම උදෙසා පාසැල් පද්ධතියේ සියලුම ගුරුවරුන් පුහුණු උපාධිධාරී ගුරුවරුන් බවට පත් කිරීමට අවශ්‍ය වන හෙයින් ද, වර්තමානයේ බහුතරයක් ගුරුවරුන් හට තෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලාවක් අවසානයේ උසස් ඩිප්ලෝමාවක් හිමිවන හෙයින් ද, වසර තුනක න්‍යායාත්මක පාඨමාලාවක් සහ එක් වසරක පාසැල් කේන්ද්‍රීය පුහුණුවක් සහිත සිව් වසරක උපාධි පාඨමාලාවක් ප්‍රදානය කිරීම සඳහා උචිත වන සේ දැනට ක්‍රියාත්මක අධ්‍යාපන විද්‍යා පීඨ දහනවය විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීමට එවකට අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 පෙබරවාරි 13 දින ඉදිරිපත් කොට අනුමතිය ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබා දෙන දුම්රිය මාර්ගයක් ලෙස කැලණිවැලි දුම්රිය මාර්ගය සලකනු ලබන හෙයින් ද, මෙම දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම තුළින් එහි ප්‍රතිලාභ රත්නපුර, බදුල්ල සහ හම්බන්තොට ඇතුළු දිස්ත්‍රික්ක රැසක ජනතාවට භුක්ති විඳිය හැකි වන හෙයින් ද, කැලණිවැලි දුම්රිය

මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳව ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්ට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා විදේශ සේවයේ පත්වීම් ලබාදීම විධිමත් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ ඔසවා තබන විදේශ සේවය සඳහා සිදු කරන ලද දේශපාලන පත් කිරීම් හේතුවෙන් එම සේවයේ ගුණාත්මකභාවය බිඳ වැටී අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබෙන හෙයින් එම තත්ත්වය වළක්වාලීම සඳහා විදේශ සේවයට සිදු කරනු ලබන සියලුම පත් කිරීම් තරඟ විභාග ප්‍රතිඵල සහ කුසලතාවය මත සිදු කිරීමට රජය විසින් වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් සකස් කිරීම,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් නොමැති වීම, ලංකා ගමනාගමන මණ්ඩලයේ පවතින දූෂිත තත්ත්වයට ප්‍රධාන හේතුවක් වන හෙයින් මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා සුදුසු ප්‍රසම්පාදන ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා සතු විෂයයන් විද්‍යානුකූල ක්‍රමවේදයකට සකස් කිරීම,— වර්තමානය වනවිට පළාත් සභා සතු විෂයයන් කිසිදු විද්‍යානුකූල පදනමක් නොමැති ආකාරයකට වෙන් කර තිබෙන හෙයින් ද, එමඟින් විවිධ ගැටලු මතු වී තිබෙන හෙයින් ද, මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා එම විෂයයන් විද්‍යානුකූල පදනමක් මත නිසි ක්‍රමවේදයකට වෙන් කර දැක්වීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංකා ගමනාගමන මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවාව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් හෙයින්, ලංකා ගමනාගමන මණ්ඩලය විසින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී සිදුවන වංචා හා දූෂණ වළක්වා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— කිරි නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වාර්ෂිකව කිරි ආනයනය කිරීම සඳහා විශාල වශයෙන් විදේශ විනිමය මෙරටින් බැහැර වන හෙයින් මෙම තත්ත්වය වළක්වාලීම සඳහා ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය ඉහළ දැමීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/2024

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දේශපාලනීකරණයෙන් තොර කිරීම,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දැඩි ලෙස දේශපාලනීකරණය වී ඇති බව පෙනී යන බැවින්, ඡන්දයෙන් තේරී පත් වන දේශපාලනඥයින් ක්‍රීඩා ආයතනවල නායකත්ව තනතුරු සඳහා තරග කිරීම සහ ඒවා හෙබවීම තහනම් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/2025

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට සාපේක්ෂව 1%ක ප්‍රතිලාභයක් සේවකයින්ට ගෙවීම,— රජයේ ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල විසින් වාර්ෂික උද්ධමන අනුපාතයට වඩා අවම වශයෙන් 1%කින් ඉහළ ප්‍රතිලාභ සේවා නියුක්තිකයින්ට ලැබෙන බවට වගබලා ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/2025

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නොමිලේ ගමන් පහසුකම් සැපයීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පොදු ප්‍රවාහන සේවා තුළ නොමිලේ ප්‍රවාහන පහසුකම් සැපයිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/2025

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වාදීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කිරීම,— විවිධ කුසලතාවලින් පිරිපුන් නව නිපැයුම්කරුවන් සහ පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා සහ ඔවුන්ගේ කුසලතා සහ නිර්මාණ වැඩිදියුණු කිරීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/2025

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන කර්මාන්තකරුවන්ට බදු සහන,— ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී, 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන දේශීය කර්මාන්තකරුවන්ට, වසර දෙකක බදු සහනයක් ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 36/2025

ගරු රවී කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය ලබා දීම,— ලියාපදිංචි ඡන්දදායකයින් වැඩි සංඛ්‍යාවකට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඇති අයිතිය අහිමි වී ඇති හෙයින් වඩාත් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් නිර්මාණය කිරීම උදෙසා වයස අවුරුදු දහ අටට වැඩි සෑම පුද්ගලයෙකුටම ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීමටත්, ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන් වීමෙන් පසු යම් පුද්ගලයෙකු ඡන්දය ප්‍රකාශ නොකරන්නේ නම් ඔවුන්ට දඩ නියම කිරීමටත් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/2025

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය වෙනස් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වර්තමානය වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සම්බන්ධව සමාජයේ විශාල කතිකාවක් නිර්මාණය වී තිබෙන හෙයින්ද, එහි නිලවරණයේ දී එක්තරා සමිති කණ්ඩායමක් සතුව ක්‍රිකට් ආයතනයේ බලය පැවතීම හේතුවෙන් අක්‍රමිකතා බහුලව සිදුවන ආයතනයක් බවට පත්වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය සංශෝධනය කිරීමට රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් 2023 වර්ෂයේ විගණන වාර්තාවේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ හදවත බඳු ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් ඉතා වැදගත් නිර්දේශ ජාතික විගණන වාර්තාවේ දක්වා ඇති හෙයින් එම නිර්දේශ ක්‍රියාවට නැංවීමට විධිමත් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 45/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල මුදල් නිසි ලෙස මහජන සේවා සඳහා යෙදවීම,— වර්තමානය වනවිට බොහෝ පළාත් පාලන ආයතන සිය මුදල් නිසි ලෙස මහජන, සෞඛ්‍ය පොදු සේවා සහ පොදු මාවත් දියුණු කිරීම වැනි කටයුතු සඳහා නොයොදවා ලාභ ඉපැයීමේ අරමුණින් ස්ථාවර තැන්පතුවල තැන්පත් කොට ඇති බවට කරුණු අනාවරණය වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීමට රජය විසින් සුදුසු වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 49/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඉන්ධන පිරවුම්හල් සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය දැඩි අවිධිමත් තත්ත්වයක පවතින බැවින්, එම තත්ත්වය විධිමත් කිරීම සඳහා නියාමන වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 51/2025

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා පීඨයක් පිහිටුවීම,— ගුරුවරුන් සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා උගන්වනු පිණිස ජාතික භාෂා පීඨයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 52/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගත් ණය වින්දිතයින් බවට පත් වූ පුද්ගලයින්ට සාධාරණය ඉටු කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගත් පිරිසෙන් අති බහුතරයක් මේ වනවිට ණය වින්දිතයින් බවට පත්ව සිටින බැවින්, එම පිරිසට සාධාරණය ඉටු කිරීම සඳහා වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 53/2025

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ටෙලි නාට්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ එම කර්මාන්තය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජනතාවට විනෝදාස්වාදය සපයන ප්‍රධාන කර්මාන්තයක් වන ටෙලි නාට්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ එම කර්මාන්තය නියාමනය කිරීම සඳහා යම් නියාමන ආයතනයක් ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 55/2025

ගරු උපුල් කිත්සිරි මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මඩුවන්වෙල වලව්ව ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකමින් යුත් ස්ථාන ආරක්ෂා කිරීම,— රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඓතිහාසික ස්ථානයක් වන මඩුවන්වෙල වලව්ව ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකමින් යුත් ස්ථාන බොහෝ ප්‍රමාණයක් පවතින හෙයින් ද, එම ස්ථාන සංචාරක ආකර්ශණයට ලක් වී ඇති හෙයින් ද, වර්තමානය වනවිට එවැනි ස්ථාන දැඩි අනාරක්ෂිත තත්ත්වයට පත් වී ඇති හෙයින් ද, මෙම ස්ථානවල මුල්

පෞරාණිකභාවයට හානියක් නොවන ලෙස සංරක්ෂණය කොට එම ස්ථාන සතු ඉඩම් කඩිනමින් මැන නිරවුල් කොට අනාගත පරපුර සඳහා ආරක්ෂා කර දෙමින් සංචාරක කර්මාන්තයට යොදා ගැනීම සඳහා ඒවා ආරක්ෂා කිරීමට වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 56/2025

ගරු උපුල් කිත්සිරි මහතා,— උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම,— උඩවලව ජාතික වනෝද්‍යානය, උඩවලව ඇත් අතුරු සෙවණ, සංඛපාල රජමහා විහාරය, උඩවලව ජලාශය, සෙවනගල සීනි කර්මාන්තශාලාව, සෙවනගල උක් පර්යේෂණ ආයතනය, උඩවලව මිරිදිය ධීවර මධ්‍යස්ථානය සහ වවුල්පන හුණුගල් ගුහාව ආදී වූ සංචාරක ආකර්ශණය ලබාගත හැකි ස්ථාන තිබුණද විධිමත් වැඩපිළිවෙළක් නොමැතිවීම හේතුවෙන් දෙස් විදෙස් සංචාරකයන්ට එහි වටිනාකම් ලබාගැනීමට නොහැකි වී ඇති හෙයින් රත්නපුර දිස්ත්‍රික්කයේ උඩවලව ප්‍රදේශය සහ මොනරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රදේශය ආවරණය වන පරිදි උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම සඳහා රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 57/2025

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා,— "ශ්‍රී ලංකා බයිතුල්මාල් අරමුදල" නමින් අරමුදලක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපනය, සංස්කෘතිය, රැකියාව සහ ජාතීන් අතර පවතින සහයෝගීතාවය සම්බන්ධ ගැටලුවලදී හා එදිනෙදා ජීවනෝපායයන් ඉටුකර ගැනීමේ දී අවශ්‍ය වන අරමුදලක් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතුව දැනට නොමැති හෙයින් ද, මෙම අවශ්‍යතාවයන් සඳහා "බයිතුල්මාල්" නමින් අරමුදලක් ලෝකයේ මුස්ලිම් රටවල්වල සහ මුස්ලිම් සුළු ජාතීන් ජීවත්වන රටවල්වල වසර ගණනාවක සිට ස්ථාපනය කර ඇති හෙයින් ද, මෙම අරමුදල ශ්‍රී ලංකාවේ ආරම්භ කළහොත් අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මෙරට ජීවත්වන අයගෙන් සහ විදේශීය රටවල්වල ජීවත්වන අයගෙන් සම්පාදනය කරගත හැකිවන හෙයින් ද, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ "ශ්‍රී ලංකා බයිතුල්මාල් අරමුදල" නමින් අරමුදලක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදුකරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 58/2025

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය,— පාසල් සිසුන්ගේ අධ්‍යාපන සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ පුද්ගල සමාජ සංවර්ධනය සඳහා සෑම පාසලකටම පුහුණුවලත් මනෝ උපදේශකවරයෙකු (Student Counsellor) පත් කිරීම,— වර්තමානයේ බොහෝ පාසල් සිසුන් අතර විවිධ මානසික පසුබෑම් දක්නට ලැබෙන හෙයින් ද, මෙම තත්ත්වයන් ඔවුන්ගේ ශාරීරික හා සමාජීය පැවැත්ම සඳහා වක්‍රාකාරව බලපාන හෙයින් ද, ඇතැම් අවස්ථාවලදී පාසල් සඳහා පාසල් මනෝ උපදේශකවරයන් පත් කර තිබුණ ද එම තනතුර සඳහා පාසල් ගුරුවරුන්ගේ භූමිකාවද ඇතුළත්වීම හරහා ඉන් බලාපොරොත්තු වන සේවය ඵලදායීව සිදු වී නොමැති හෙයින් ද, සෑම පාසලකටම මනෝ උපදේශකයකවරයෙකුගේ අවශ්‍යතාවය මතු වී ඇති හෙයින් ද, පාසල් සිසුන්ගේ අධ්‍යාපන සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය හා පුද්ගල සමාජ සංවර්ධනය සඳහා සෑම පාසලකටම පුහුණුවලත් මනෝ උපදේශකවරයෙකු පත් කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 59/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් වන "රටවිරුවන්" වෙනුවෙන් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය පණ ගැන්වීම සඳහා විදෙස්ගත ශ්‍රමික ප්‍රජාවගෙන් ලැබෙන දායකත්වය ඉතා සුවිශේෂ වන හෙයින් ද, ආර්ථික අර්බුදය හමුවේ විදෙස් රටවල වසර ගණනාවක් රැකියා කිරීමෙන් අනතුරුව නැවත ශ්‍රී ලංකාවට පැමිණ තම දූ දරුවන්ද සමඟින් ජීවිකාව ගෙන යන ඔවුන්ට ඇතැම් අවස්ථාවලදී නැවත රැකියාවක් කිරීමට තරම් හැකියාවක් නොමැතිවීම හේතුවෙන් විවිධ ගැටලුවලට මුහුණපෑමට සිදුවන හෙයින් ද, ඔවුන්ගෙන් විදේශ විනිමය වශයෙන් ලැබෙන මුදලින් යම් ප්‍රතිශතයක් යොදාගෙන විශ්‍රාම අරමුදලක් පිහිටුවා විශ්‍රාම යෝජනා ක්‍රමයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 61/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ පිහිටි ආපනශාලාවන්හි ළමුන්ට අහිතකර ආහාර අලෙවි කිරීම නතර කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පාසල් දරුවන් අතර දියවැඩියාව රෝගය බහුල වශයෙන් හඳුනාගෙන ඇති බව විශේෂඥ වෛද්‍යවරුන් පෙන්වා දී තිබෙන හෙයින්ද, දියවැඩියාව රෝගය සඳහා ආහාර වර්ග මෙන්ම ආහාර පුරුදු සහ ආහාර රටාව හේතු වන හෙයින්ද, ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුල පිහිටි පාසල් ආපනශාලාවන්හි දියවැඩියාව සඳහා හේතු වන්නා වූ සීනි සහ පිටි සහිත ආහාර මෙන්ම ෆ්‍රයිඩ් රයිස්, කොත්තු, ක්ෂණික නූඩ්ල්ස් වැනි ආහාර වර්ග ඉතා විශාල වශයෙන් පාසල් ළමුන්ට අලෙවි කරන හෙයින්ද, අප රටේ පාසල් දරුවන් අතර දියවැඩියා රෝගී තත්ත්වය පාලනය කිරීම සඳහා පාසල් ආපනශාලාවල අළෙවි කළ යුතු ආහාරපාන වර්ග පිළිබඳව රජය විසින් යම් සීමාවන් පැනවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 62/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම,— ශ්‍රී ලංකාවේ දුම්රිය සේවය ආරම්භ කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වූයේ භාණ්ඩ ප්‍රවාහනය හෙයින්ද, මේ වනවිට දුම්රිය සේවය එයින් බැහැර වී ඇති හෙයින්ද, දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය වියදම් අඩු ක්‍රමයක් වන හෙයින්ද, එහි ප්‍රතිලාභ රටේ ජනතාවට ඍජුවම අත්වන හෙයින්ද, හැකි සෑම අවස්ථාවකදීම දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය මෙන්ම ඉන්ධන ප්‍රවාහනය සඳහා රජය විසින් නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 63/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— සිය කෘෂි නිෂ්පාදන අළෙවි කිරීමේදී ගොවීන්ට සිදුවන අසාධාරණය අවම කිරීම,— සිය කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීමේදී තොග වෙළඳුන් මෙන්ම සිල්ලර වෙළඳුන් විසින් ද ඉතා අඩු මුදලක් නියම කිරීම හේතුවෙන් මෙරට ගොවීන් බරපතල අසාධාරණයකට ලක්වන හෙයින්ද, එකී භාණ්ඩ වෙළඳුන්ගෙන් මිලදී ගැනීමේදී පාරිභෝගික ජනතාවට වැඩි මිලක් ගෙවීමට සිදුව ඇති හෙයින්ද, ගොවියාත්, පාරිභෝගිකයාත් එකවර අසාධාරණයන්ට ලක් කරන්නා වූ මෙකී ක්‍රියාදාමයන් වෙනස් කරමින්, ගොවියාට සහ පාරිභෝගිකයාට සාධාරණයක් ඉටු කර දීම වෙනුවෙන් රජය විසින් කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 64/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— පෙර පාසල් අධ්‍යාපනය නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම,— මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සියලුම අධ්‍යාපන අවස්ථා අතරින් පෙර පාසල් අධ්‍යාපනය අතිශය වැදගත් සහ තීරණාත්මක වන හෙයින්, ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනය එක් ආයතනයකින් නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 65/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— අපනයන නිෂ්පාදකයින්ට පහසුකම් සැපයීම,— අපනයනය ඉලක්ක කර ගනිමින් කෘෂිකාර්මික සහ වෙනත් භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදකයන්ට අපනයන වෙළඳපොළට ප්‍රවේශ වීම සඳහා ප්‍රමාණවත් තරම් පහසුකම්, දැනුම සහ ප්‍රවේශ මාර්ග නොමැති හෙයින්, විදේශ විනිමය උත්පාදනයේ ප්‍රධාන සංරචකයන් වන අපනයන ක්ෂේත්‍රයේ නියැළි තරුණ ව්‍යවසායකයින්ට ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 66/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— උසස් පෙළ විද්‍යා, වාණිජ සහ තාක්ෂණවේදය විෂය ධාරාවන්ට සාහිත්‍යය විෂය හඳුන්වා දීම,— ශ්‍රී ලංකාවේ පාසල්වල විද්‍යා, වාණිජ සහ තාක්ෂණවේදය විෂය ධාරාවන්ගෙන් උසස් පෙළ හදාරන සිසුන්ගේ සාහිත්‍ය රසාස්වාදය ඉහළ නැංවීම සඳහා එම විෂය ධාරාවන් සඳහා අමතර විෂයයක් ලෙස සාහිත්‍යය විෂය හඳුන්වා දියයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 67/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— රෝහල්වල නේවාසික රෝගීන්ට උපස්ථානය සැලසීම,— රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගියෙකු අසල, රෝගියාගේ රැකවරණය සඳහා දිවා හා රාත්‍රී කාලයන්හි භාරකරුවෙකු නතර කළ යුතු බවට වාට්ටු භාර හෙද නිලධාරින් විසින් දැනුම් දෙනු ලබන හෙයින්ද, එලෙස භාරකරුවෙකු නොමැති අවස්ථාවකදී පෞද්ගලික උපස්ථාන සේවකයින් ගාස්තු ගෙවා ලබා ගත යුතුව ඇති හෙයින්ද, එකී උපස්ථාන සේවකයින් දිනකට රු. 3500 ක පමණ මුදලක් අය කරන හෙයින්ද, දින කිහිපයක් රෝහල් ගතව සිටීමට සිදු වුවහොත් එය දරා ගැනීමට අපහසු මුදලක් වන හෙයින්ද, රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගියෙකුගේ රැකවරණය සහ උපස්ථානය, රෝහලේ සේවය කරනු ලබන උපස්ථායකවරුන් විසින් ලබා දීමේ ක්‍රමවේදයක් රජය විසින් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 68/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— ඉඩම් සඳහා බලපත්‍රලාභී ඔප්පු හිමියන්ට ස්ථිර ඔප්පු ලබා දීම,— රටේ ජනතාවගෙන් සැලකිය යුතු පිරිසකට ස්වකීය ඉඩම සඳහා හිමිව ඇත්තේ බලපත්‍ර හෝ ස්වර්ණ භූමි වැනි ඔප්පු වන හෙයින්, ඔවුන් සඳහා ඔප්පු ලබා දීමේ නිවැරදි ක්‍රමවේදයක් සැකසිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 70/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— යාපනයේ සංචාරක සේවා ප්‍රවර්ධනය කිරීම හා ආර්ථිකය සංවර්ධනය කිරීම, — ශ්‍රී ලංකාවේ යාපනය ප්‍රදේශයේ සංචාරක සේවා ප්‍රවර්ධනය කිරීම සහ ආර්ථිකය සංවර්ධනය කිරීම මඟින් මෙරට සංචාරක ආර්ථිකය ශක්තිමත් කිරීමටත්, රැකියා නිර්මාණය කිරීමටත්, යාපනය සජීවී සංස්කෘතික ගමනාන්තයක් ලෙස පිළිබිඹු කිරීමටත් හැකි වන බැවින්, යාපනය සහ ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය ප්‍රධාන සංචාරක කේන්ද්‍ර ලෙස පිළිගැනීමට සහ දේශීය හා විදේශීය සංචාරකයින් ප්‍රදේශයේ හෝටල්, අවන්හල් සහ සේවා සපයන්නන් සමඟ සම්බන්ධ කිරීම, සැබෑ සංචාරක අත්දැකීම් ප්‍රවර්ධනය කිරීම, ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයට සංචාරකයින් පැමිණීම සහ ඔවුන්ගේ තෘප්තිමත්භාවය ඉහළ නැංවීම සඳහා යටිතල පහසුකම්, ඩිජිටල් සම්බන්ධතාවය සහ අළෙවිකරණය වැඩි දියුණු කරන ප්‍රතිපත්ති සහ ආයෝජන සඳහා සහාය වන, ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ නියුතු වූවන් සවිබල ගන්වන සහ සංස්කෘතික උරුමය ප්‍රවර්ධනය කරන සංචාරක සේවා ව්‍යාපාර දිරිමත් කිරීම සහ ඒවාට පහසුකම් සැලසීම මඟින් යාපනය ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සහ ආර්ථික වර්ධනය වැඩිදියුණු කරන රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කිරීම මඟින් සහ මාස 12 සිට 18 දක්වා වූ කාලයක් තුළ තිරසාර ආර්ථික ප්‍රතිලාභ ඉලක්ක කර ගනිමින් ප්‍රදේශයේ රැකියා සහ ව්‍යාපාරික අවස්ථා කෙරෙහි එවැනි වැඩසටහන් මඟින් ඇති කරන බලපෑම නිරීක්ෂණය කිරීම මඟින් යාපනය කේන්ද්‍ර කරගත් සංචාරක වේදිකාවක් නිර්මාණය කිරීම සඳහා සහාය දීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 71/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— යාපනය හා උතුරු පළාත තුළ තරුණයන් සඳහා තිරසර රැකියා අවස්ථා නිර්මාණය කිරීම පිණිස ස්ථිර විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම,— ස්ථිර විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම මඟින් රජයට ආර්ථික වර්ධනය උත්තේජනය කොට දේශීය හා විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගනිමින් තරුණයින් සඳහා තිරසර රැකියා අවස්ථා ජනනය කළ හැකි හෙයින් ද, එවැනි කලාප සංවර්ධනය කිරීමෙන් රජයට කාර්මික ව්‍යාප්තිය ප්‍රවර්ධනය කිරීම, කුසලතා සංවර්ධනය වැඩි දියුණු කිරීම හා ව්‍යවසායකත්වය දිරිමත් කිරීම තුළින් විරැකියාවට විසඳුම් ලබාදිය හැකි හෙයින් ද, යාපනයේ උතුරු පළාතේ සහ සමස්තයක් වශයෙන් රටේ දිගුකාලීන සමාජ-ආර්ථික ප්‍රගතියක් ඇති කිරීමට රට පුරා අනෙකුත් උපායමාර්ගික ස්ථාන වලට සමගාමීව යාපනයේ සහ උතුරු පළාතේ ද ස්ථිර විශේෂ ආර්ථික කලාපයක් (SEZ) ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 72/2025

ගරු කන්දසාමි ප්‍රභු මහතා,— කිරි නිෂ්පාදන අංශයෙන් ස්වයංපෝෂිතත්වය ප්‍රවර්ධනය කිරීම,— වර්තමානයේ මෙරට සැලකිය යුතු විදේශ විනිමය අහිමි වීමකට මගපාදමින් ආනයනික කිරි නිෂ්පාදන මත යැපෙන හෙයින්ද, උසස් ගව වර්ග, පශු වෛද්‍ය උපස්ථානය, සත්ව ආහාර හා යටිතල පහසුකම් සඳහා සීමිත ප්‍රවේශයක් තිබීම වැනි ගැටළුවලට ගොවීන් මුහුණපාන හෙයින්ද, මෙම අභියෝග ආමන්ත්‍රණය කිරීම මඟින් ආහාර සුරක්ෂිතතාව වර්ධනය කොට, ග්‍රාමීය රැකියා ජනනය කරමින්, ආනයන මත යැපීම අඩු කර ගත හැකි හෙයින්ද, අභිජනනය සහ පශු වෛද්‍ය සේවා වෙත ප්‍රවිශ්ටය දියුණු කිරීමෙන්, සත්ව ආහාර වගාව ව්‍යාප්ත කිරීමෙන්, ගොවි පුහුණුව හා යටිතල පහසුකම් ශක්තිමත් කිරීමෙන්, කිරි ගොවීන්ට දිරිගැන්වීම් ලබා දීමෙන්, රාජ්‍ය-පෞද්ගලික

හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කිරීමෙන් සහ කිරිපට්ටි සංවර්ධනය පිළිබඳ පර්යේෂණ දිරිගැන්වීමෙන්, කිරිවලින් ස්වයංපෝෂිතභාවය සාක්ෂාත් කර ගනු පිණිස රජය විසින් ජාතික කිරිපට්ටි සංවර්ධන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු බවටද, අදාළ අමාත්‍යාංශ විසින් පළාත් සභා හා ගොවි කණ්ඩායම් සමඟ සම්බන්ධීකරණය වීම සඳහා යාන්ත්‍රණයක් ඇති කරනු ලැබිය යුතු බවටද, අදාළ පාර්ලිමේන්තු කාරක සභාව විසින් වැඩිදුර ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ නිර්දේශ කිරීම නිරීක්ෂණය කරනු ලැබිය යුතු බවටද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 73/2025

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය සම්පන්නභාවය සඳහා වඩා හොඳ අවස්ථා ලබා දීම,— ජනගහනයෙන් බහුතරයක් විවෘත හදවත් සැත්කම්වලට භාජනය වන හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය සඳහා වඩා හොඳ අවස්ථා ලබා දිය යුතු බවටත්, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයන්ට සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල හරහාද, රජයේ සේවකයින්ට සහ රැකියා නියුක්තිකයන් නොවන අයට රජය විසින් ජනාධිපති අරමුදල හරහාද පූර්ණ පිරිවැය සහිතව නොමිලේ පහසුකම් සලසා දිය යුතු බවටත් මෙම සභාව යෝජනා කර සිටී.

පා. 74/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— සතියේ වැඩ කරන දිනවල ප්‍රධාන නගර ආශ්‍රිතව උදෑසන කාලයේදී සහ සවස් කාලයේදී බස් ප්‍රමුඛතා මංතීරු කඩිනමින් ඇති කිරීම,— ප්‍රධාන නගර ආශ්‍රිතව උදෑසන හා සවස් කාලයේදී පවතින දැඩි මාර්ග තදබදයට පිළියමක් ලෙස උදෑසන සහ සවස් කාලයන්හිදී බස් ප්‍රමුඛතා මංතීරු ක්‍රමයක් ක්‍රියාවට නැංවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 75/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ඉතාලි-ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික රියදුරු බලපත්‍ර ගිවිසුම යාවත්කාලීන කිරීම,— ඉතාලි-ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික රියදුරු බලපත්‍ර ගිවිසුම මඟින් ශ්‍රී ලාංකිකයන්ට විශාල ප්‍රතිලාභ හිමිවන හෙයින්, එම ගිවිසුම නැවත යාවත්කාලීන කිරීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 76/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— සුහුරු විදුලිබල පද්ධතියක් සහ සුහුරු මීටර් හඳුන්වා දීම,— පුනර්ජනනීය බලශක්ති ප්‍රභේදයක් ලෙස සූර්ය බලශක්තිය ප්‍රවර්ධනය ඉතා වැදගත් වුවත්, විශේෂයෙන්ම වහල මත සවිකරන ලද සූර්ය පැනල මඟින් ජනනය වන විදුලි ප්‍රමාණය, පද්ධති පාලන මධ්‍යස්ථානයේදී වෙන්කර හඳුනාගත නොහැකි හෙයින්, ජාතික විදුලිබල පද්ධතිය (Grid) සුහුරු තත්ත්වයට (Smart Grid) පත්කිරීමටත්, සුහුරු මීටර් (Smart Meters) හඳුන්වා දීමටත් කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 77/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ආහාර රස ගැන්වීමට යොදන අහිතකර කෘත්‍රිම රසකාරක තහනම් කිරීම,— රයිස්, කොත්තු හා නූඩ්ල්ස් වැනි ආහාර රස ගැන්වීමට මෙරට ආපනශාලා සහ හෝටල්වලදී යොදන කෘත්‍රිම රසකාරක, නොයෙක් බෝ නොවන රෝගවලට හේතු වන බව වාර්තාවන හෙයින්, ඒ පිළිබඳව පිළිගත් ආයතනයක් මඟින් නිසි අධ්‍යයනයක් සිදුකර, එම අහිතකර රසකාරක තහනම් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 78/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— මඩකලපුව සිට පොතුවිල් දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීම හෝ මාතර සිට කල්මුණේ දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීම,— මඩකලපුව සිට පොතුවිල් දක්වා දුම්රිය මාර්ගය සහ මාතර සිට කල්මුණේ දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීම මඟින් මඩකලපුව, අම්පාර හා මොනරාගල යන දිස්ත්‍රික්කවල විශාල ජනතාවකට ප්‍රතිලාභ ලැබෙන හෙයින්, මඩකලපුව සිට පොතුවිල් දක්වා හෝ මාතර සිට කල්මුණේ දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 79/2025

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය,— ජපන් ජබර ශාකයේ ව්‍යාප්තිය හිතකර ලෙස පාලනය හා මර්දනය කිරීම,— ජපන් ජබර නොහොත් Eichhornia crassipes (Mart.) Solms යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන ආක්‍රමණශීලී ශාකය, වර්තමානයේ ගොවි බිම් සහ වගුරු බිම් වසා පැතිරී ගොස් ඇති හෙයින් ද, මෙහි ශීඝ්‍ර වර්ධන වේගය හේතුවෙන් දේශීය ශාක අභිබවා ජෛව පරිසර පද්ධතියට තර්ජනයක් වී ඇති හෙයින් ද, මෙම තත්ත්වය හේතුවෙන් රොන් මඩ තැන්පත් වී ජල ප්‍රවාහන මාර්ග සහ ජල බැස්ම අවහිර වීම මඟින් ජල ගැලීම් හා ගංවතුර තත්ත්ව ඇති වී ඇති හෙයින් ද, එදිනෙදා භාවිතයට අවශ්‍ය වන ජලයේ තත්ත්වයට හානිවීම සහ ජල විදුලි උත්පාදනයේදී බාධා ඇති වී ඇති හෙයින් ද, රසායනික වල් නාශක භාවිතය මඟින් ඒවා මර්දනය එම ජලය පරිහරණය කරන පුද්ගලයින්ට සෞඛ්‍ය අවදානමක් ඇති කරන හෙයින් ද, මදුරු කීටයන් බෝවීම හා එමඟින් බරවා හා ඩෙංගු වැනි රෝග ව්‍යාප්තවීම සිදු වී ඇති හෙයින් ද, මෙම ශාකය හිතකර ලෙස පාලනය හා මර්දනය මඟින් තිරසර විසඳුමක් උදෙසා රජය විසින් අදාළ ව්‍යාපෘති යෝජනා සැකසීම කාලෝචිත බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 80/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— කොරෝනා වසංගතය පැවති කාලය තුළ, ඒකපාර්ශ්විකව හා බලහත්කාරයෙන් මුස්ලිම් ජනතාවගේ මෘතදේහ ආදාහනය කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවක් පිහිටුවීම,— කොරෝනා වසංගතය පැවති කාලය තුළ, ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශයන්ට පටහැනිව ඒකපාර්ශ්විකව හා බලහත්කාරයෙන් ආදාහනය කරන ලද මුස්ලිම් ජනතාවගේ මෘතදේහ සංඛ්‍යාව, එලෙස ආදාහනය කරන ලද පුද්ගලයින්ගේ නම් හා ලිපිනයන් යනාදී තොරතුරු විමර්ශනය කිරීම සඳහාත්, මෙසේ මෘතදේහ බලහත්කාරයෙන් ආදාහනය කිරීමට හේතු වූ පසුබිම මෙන්ම බලහත්කාරයෙන් ආදාහනය කරන ලද පුද්ගලයින්ගේ ඥාතීන්ගේ මානසික තත්ත්වය පිළිබඳව විමර්ශනය කිරීම සඳහාත්, මෙයට අනුබල දෙමින් මාර්ගෝපදේශයන්ට

පටහැනිව කටයුතු කළ දේශපාලනඥයන් ඇතුළු රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ගත යුතු පියවර පිළිබඳව විමර්ශනය කිරීම සඳහාත්, කොමිෂන් සභාවක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 81/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— රසායන ද්‍රව්‍ය යොදා පලතුරු ඉදවීම නතර කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පලතුරු වෙළඳපොළ තුළ ස්වාභාවිකව පැසී ඉදුණු පලතුරු වෙනුවට, නොපැසුණු පලතුරු රසායන ද්‍රව්‍ය යොදා කෘත්‍රිමව ඉදීමට සලස්වා අලෙවි කරනු ලබන හෙයින් ද, ආනයනික පලතුරු ද රසායන ද්‍රව්‍ය යොදා කෘත්‍රිමව ඉදීමට සලස්වා අලෙවි කරනු ලබන හෙයින් ද, මෙම පලතුරු වැඩි වශයෙන් දරුවන් විසින් ආහාරයට ගනු ලබන හෙයින් ද, කූට ව්‍යාපාරිකයින් රටේ අනාගතය විනාශ කරමින් ලාභ ලැබීමේ පරමාර්ථයෙන් සිදු කරන මෙම ක්‍රියාව නතර කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— ආයතන ප්‍රධානීන් පත්කිරීමේ නිර්ණායකයක් ලෙස ප්‍රධාන කාර්ය සාධන දර්ශකය යොදා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීමේ දී ජ්‍යෙෂ්ඨත්වය සේම ඔවුන්ගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPl - Key Performance Indicator) නිර්ණායකයක් ලෙස යොදා ගැනීම සඳහා ක්‍රමවේදයක් රාජ්‍ය සේවයට ඇතුළත් කොට, ඒ අනුව ආයතන ප්‍රධානීන් පත්කිරීමට නිර්දේශ ලබා ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් හට තනතුරු ලබා දීමේ දී ප්‍රධාන කාර්ය සාධන දර්ශකය සලකා බැලීම, — පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ අමාත්‍යවරුන්ගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPI - Key Performance Indicator) වාර්ෂිකව පරීක්ෂා කර, ඔවුන්ට තනතුරු ලබා දීමේ දී එකී දර්ශකය සලකා බලා, තනතුරු ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍ර විනිශ්චයකාරවරයාගේ සිට අධිකරණ ක්ෂේත්‍රයේ පහළ නිලයන් දක්වා තනතුරු දැරූ තැනැත්තන් වෙනත් තනතුරුවලට පත්කිරීමේ දී ඔවුන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම, — අග්‍ර විනිශ්චයකාරවරයාගේ සිට අධිකරණ ක්ෂේත්‍රයේ පහළ නිලයන් දක්වා තනතුරු දැරූ තැනැත්තන්, ඔවුන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන්, එකී තනතුරු දැරීම නතර වූ තැන් සිට අවම වශයෙන් වසර තුනක කාලයක් රාජ්‍ය සේවයේ, සංස්ථාපිත මණ්ඩල, කොමිෂන් සභා, විනිශ්චය මණ්ඩලවල හෝ විදේශ සේවයේ (තානාපති වැනි) තනතුරුවලට පත් නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— දේශපාලන පක්ෂ විසින් මහජන නියෝජිතයින්ගේ වැටුප්, දීමනා සහ වාහන බලපත්‍ර ආදිය තම පක්ෂවල අරමුදල් සඳහා බැර කර ගැනීම නතර කිරීම,— දේශපාලන පක්ෂ විසින් තම පක්ෂයෙන් තේරී පත් වූ මහජන නියෝජිතයින්ගේ මාසික වැටුප්, දීමනා සහ වාහන බලපත්‍ර ආදිය එම පක්ෂවලට ලබා ගැනීම මහජන නියෝජිතයින්ගේ ස්වාධීනත්වය අහෝසි වන ක්‍රියාවක් වන හෙයින් ද, එය ප්‍රජාතන්ත්‍රවාදයට බරපතල අභියෝගයක් වන හෙයින් ද, මෙලෙස දේශපාලන පක්ෂ විසින් මහජන නියෝජිතයින්ගේ වැටුප්, දීමනා සහ වාහන බලපත්‍ර ආදිය තම පක්ෂවල අරමුදල් සඳහා බැර කර ගැනීම නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 87/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— සෑම දිස්ත්‍රික්කයකම මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— මේ වනවිට හෙරොයින් වැනි මත් ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ ශීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබෙන හෙයින් ද, ඒ සඳහා ඇබ්බැහිවූවන් ප්‍රදේශයකට සීමා නොවී රට පුරා ව්‍යාප්තව සිටීම සහ ඔවුන්ගෙන් ප්‍රචාරණය වීම මෙයට හේතු වී තිබෙන හෙයින් ද, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථාන රට පුරා ස්ථාන කිහිපයක පමණක් පැවතීම මත් ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ වර්ධනය පාලනය කිරීමට දැඩි ගැටලුවක්ව ඇති හෙයින් ද, එයට විසඳුමක් ලෙස සියලු පහසුකම් සහිතව අවම වශයෙන් දිස්ත්‍රික්කයකට එක් පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 88/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— ශ්‍රී ලංකාවේ වන සතුන් කළමනාකරණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සහ ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වශයෙන් ජෛව විවිධත්වයෙන් ඉහළ රටක් ලෙස සැලකෙන හෙයින් ද, වනාන්තර විනාශය, මිනිසුන්ගේ ආක්‍රමණය හේතුවෙන්, නීති විරෝධී වන සතුන් වෙළඳාම, මිනිසා සහ වන සතුන් අතර ගැටුම් වර්ධනය වීම නිසා වාර්ෂිකව මෙම සතුන් මෙන්ම මිනිස් ජීවිත ද විශාල වශයෙන් අහිමි වන හෙයින් ද, නව ප්‍රතිපත්ති සහ සැලසුම් මඟින් ජාතික වන සතුන් කළමනාකරණ ප්‍රතිපත්තියක් සකස් කිරීම තිරසර සංවර්ධන අරමුණක් වන හෙයින් ද, එමඟින් සතුන්ගේ වාසස්ථාන ආරක්ෂා වීම, මිනිසා සහ වන සතුන් අතර ගැටුම් අවම වීම, ගොවි ජනතාවගේ ආර්ථික මට්ටම සහ සමාජ ජීවිතය උසස් වීම සිදුවන හෙයින් ද, ඒ සඳහා ක්‍රියාත්මක කළ හැකි ප්‍රායෝගික හා නවීන ප්‍රතිපත්තියක් සහ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම් වඩාත් ඵලදායි ලෙස භාවිතා කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය රටේ ආර්ථිකයේ මූලික අංශයක් වන හෙයින් ද, වාර්ෂිකව නිෂ්පාදන ක්‍රියාවලියට යොදවනුයේ කෘෂිකාර්මික ඉඩම්වලින් 40%කට ආසන්න ප්‍රමාණයක් පමණක් වන හෙයින් ද, ඉතිරි ඉඩම් නිසි ලෙස සැලසුම් නොකිරීම, ජල සම්පත් හිඟය, තාක්ෂණික දැනුම නොමැති වීම සහ නව්‍යකරණය නොවීම හේතුවෙන් භාවිතා නොවන හෙයින් ද, නිෂ්පාදන මට්ටම අඩු වීම මඟින් ආහාර ආනයනය සඳහා වසරකට විශාල මුදලක් වැය වන හෙයින් ද, කෘෂිකාර්මික නිෂ්පාදනයේ වර්ධනය ඉදිරි වසර කිහිපය තුළ 30%කින් වැඩි කිරීමටත්, ඉන් ගොවීන්ගේ ආදායම වැඩි

කිරීමටත්, වාණිජ කෘෂිකර්මයේ ව්‍යාප්තිය වැඩි කිරීමටත්, සියලුම කෘෂිකාර්මික භූමි ගවේශණය කර, භූමියෙහි වර්ගය, බෝගවලට යෝග්‍ය බව, ජලය සහ ගොවිතැන පිළිබඳ තොරතුරු ඇතුළත් මූලික දත්ත පද්ධතියක් සකස් කිරීම මඟින් රටේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීමටත්, ගොවීන්ගේ ජීවන මට්ටම උසස් කිරීමටත්, ඉඩම් වඩාත් ඵලදායි ලෙස භාවිතා කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/2025

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— යාපනය දිස්ත්‍රික්කයේ අක්වෙරළ දූපත්වල පදිංචිකරුවන් සඳහා මුහුදු ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම,— යාපනය දිස්ත්‍රික්කයේ විශේෂයෙන් නෙඩුන්තීව්, නයිනතීව්, එලුවයිතීව් සහ අනලයිතීව් වැනි අක්වෙරළ දූපත්වල පදිංචිකරුවන්ට දශක ගණනාවක් තිස්සේ ප්‍රමාණවත් මුහුදු ප්‍රවාහන පහසුකම් අහිමි වී ඇති හෙයින් ද, එහි ප්‍රතිඵලයක් ලෙස, ඔවුන්ට මුහුදු මාර්ගයෙන් පැය කිහිපයක් ගමන් කිරීමට සිදු වන හෙයින් ද, රෝගීන්, ගර්භනී කාන්තාවන්, වැඩිහිටියන්, පාසල් කාර්ය මණ්ඩලය සහ රාජ්‍ය නොවන සංවිධානවල සේවකයින් මෙම ගමන්වලදී දැඩි දුෂ්කරතා සහ අවදානම්වලට මුහුණ දෙන හෙයින් ද, ''ගම් සංවර්ධනය ජාතියේ සංවර්ධනය'' බව පිළිගෙන ඇති හෙයින් ද, එම දූපත්වල පදිංචිකරුවන්ට නවීන, ආරක්ෂිත, වේගවත් සහ විශ්වාසදායක මුහුදු ප්‍රවාහන පහසුකම් සැපයීමට රජය වහාම පියවර ගත යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/2025

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— තලෙයිමන්නාරම-රාමේෂ්වරම් බෝට්ටු සේවාව ආරම්භ කිරීම,— තලෙයිමන්නාරම-රාමේෂ්වරම් බෝට්ටු සේවය ආරම්භ කිරීම මඟින් විශේෂයෙන්ම ඉන්දියාවේ සිට මෙරටට සංචාරකයින් පැමිණීම වැඩි කරනු ලැබිය හැකි හෙයින් ද, එමඟින් මහජනතාවට අඩු වියදමකින් තමිල්නාඩුවට ගමන් කර පවතින නීති හා රෙගුලාසිවලට යටත්ව දැරිය හැකි මිලකට අත්‍යවශ්‍ය භාණ්ඩ මිල දී ගැනීමට හැකියාව ලබා දී ඔවුන්ගේ ජීවනෝපායන් වැඩිදියුණු කළ හැකි හෙයින් ද තලෙයිමන්නාරම-රාමේෂ්වරම් බෝට්ටු සේවාව ආරම්භ කිරීම සඳහා රජය වහාම පියවර ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 93/2025

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සංවර්ධනයේ කලාපීය විෂමතා අවම කිරීම සඳහා වෙන් වූ විශේෂ සංවර්ධන අරමුදලක් පිහිටුවීම,— පසුගිය දශක කිහිපය තුළ දිග්ගැස්සුනු සිවිල් අරගල සහ ඓතිහාසිකව සිදුවුණු නොසලකා හැරීමෙන් ඇති වූ බලපෑම් හේතුවෙන් උතුරු පළාත, නැගෙනහිර පළාත, මොනරාගල දිස්ත්‍රික්කය සහ නුවරඑළිය දිස්ත්‍රික්කය වැනි පසුගාමී කලාප දැඩි ආර්ථික දුෂ්කරතාවන්ට මුහුණ දෙමින් සිටින හෙයින්ද; වර්තමාන ආර්ථික අර්බුදය තුළින් මෙම පසුගාමී කලාපවල ජනතාවගේ ජීවනෝපායන් මත අසමානුපාතික බරක් පටවමින් මෙම විෂමතා තවදුරටත් උග්‍ර කර ඇති හෙයින්ද; ආර්ථික වශයෙන් අසාධාරණයට ලක් වූ ප්‍රදේශවල සාධාරණ වර්ධනය, තිරසාර සංවර්ධනය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය බලගැන්වීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙම ගැටලු විසඳීම සඳහා වෙන් වූ ජාතික වැඩසටහනක් ස්ථාපිත කිරීම අවශ්‍ය වන හෙයින්ද; වසර 10+2 වැඩසටහන් කාලපරිච්ඡේදයක් තුළ ඇමරිකානු ඩොලර් මිලියන 250 ක ඉලක්කගත ප්‍රමාණයකින් රජයේ, ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික හවුල්කරුවන්, පෞද්ගලික ආයෝජකයින් සහ පරිත්‍යාගශීලී දානපතියන්ගෙන් දායක මුදල් රැස් කිරීම

වෙනුවෙන් එම පසුගාමී කලාප සඳහා ජාතික සංවර්ධන අරමුදලක් ස්ථාපිත කිරීමටත්; කෘෂිකර්මාන්තය, ධීවර හා ගෘහ කර්මාන්ත හරහා ග්‍රාමීය ජීවනෝපායන් නඟාසිටුවීම, සේවා නියුක්තිය සහ කාන්තාවන් සමාජීය හා ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, අක්‍රිය වත්කම් සක්‍රිය කිරීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ සමුපකාර සඳහා සහාය වීම, පුනර්ජනනීය බලශක්තිය සහ අනෙකුත් වාණිජමය වශයෙන් ශක්‍ය ව්‍යාපාර සඳහා ආයෝජනය කිරීම, ධාරිතා වර්ධනය සහ කාන්තාවන් සහ තරුණයින් දැනුවත් කිරීම ආරම්භ කිරීම සඳහා අරමුදල් උපායමාර්ගිකව යෙදවීමටත්; දේශීය ධාරිතාව ගොඩනැගීම සඳහා ආයෝජනවල ශක්‍යතාවන්හි අඩුපාඩු නැවැත්වීම සහ අරමුදල් ඵලදායී හා විනිවිදභාවයෙන් යුක්තව භාවිතා කිරීම සහතික කිරීම සඳහා තාක්ෂණික සහාය පහසුකමක් (TAF) ස්ථාපිත කිරීමට පහසුකම් සැලසීමටත්; ආර්ථික ක්‍රියාකාරකම් සහ තීරණ ගැනීමේදී කාන්තා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා මැනිය හැකි ඉලක්ක සහිතව, සියලුම ආයෝජන ක්ෂේත්‍ර හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළත් කිරීම සහතික කිරීමටත්; ශ්‍රී ලංකාවේ සියල්ල ඇතුළත් වන වර්ධනය, සංහිඳියාව සහ තිරසාර සංවර්ධනය සඳහා හදිසි ජාතික පියවරක් ලෙස අරමුදල පිහිටුවීම සලකා බැලීමෙන්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සාධාරණ කලාපීය ආවරණය, වගවීම සහ තිරසාරභාවය සහතික කිරීම සඳහා අරමුදල සමඟ සම්බන්ධීකරණය කිරීමට අදාළ අමාත්‍යාංශ, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට බලය පැවරීමටත් ශ්‍රී ලංකා රජය පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 94/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීමට වැඩසටහනක් සකස් කිරීම,— පරිසර සමතුලිතතාවයට හා ධීවර කර්මාන්තයට අතිශය වැදගත් වන කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— පෞද්ගලික බස්රථ සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය විධිමත් කිරීම,— පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් සිදුකරන පෞද්ගලික බස්රථ සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය අතිශයින් දූෂිත තත්ත්වයට පත්වී තිබෙන බැවින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා සුදුසු වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 97/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ශ්‍රී ලංකාවේ දරු උපත් සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා පවුල් ඒකකයන් වෙත දිරි දීමනාවක් ලබා දීම,— 2018 වසරේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්ෂික දරු උපත් සංඛ්‍යාව අඛණ්ඩව පහත යමින් තිබෙන බව නිරීක්ෂණය වී ඇති හෙයින් ද, එහි ප්‍රතිඵලයක් ලෙස අනාගතයේ ශ්‍රී ලංකාවේ තරුණ ජනගහනය පහළ යාම නියත වශයෙන් සිදුවන හෙයින් ද, තරුණ ජනගහනය පහළ යාම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයට ඉතා අගතිදායක ලෙස බලපාන හෙයින් ද, ශ්‍රී ලංකාවේ දරු උපත් සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා පවුල් ඒකක වෙත ආකර්ශණීය දිරි දීමනාවක් ලබා දීමට රජය විසින් පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— 'සූර්ය බල සංග්‍රාමය' ව්‍යාපෘතිය ප්‍රවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ බලශක්ති මූලාශ්‍රයන් අතරින් සූර්ය විදුලි බලය ලාබදායි සහ පරිසර හිතකාමී මූලාශ්‍රයක් ලෙස හඳුනාගෙන ඇති හෙයින් ද, 2016.09.06 දින ආරම්භ කරන ලද 'සූර්ය බල සංග්‍රාමය' (Battle for Solar Energy) ව්‍යාපෘතිය මඟින් දැනටමත් ජාතික විදුලි පද්ධතියට සූර්ය විදුලි බලය 2000 MWට වැඩි ප්‍රමාණයක් එක් කර ඇති හෙයින් ද, විදුලි ඒකකයක මිල අඩු කිරීමේ ක්‍රමවේදයක් සහ පරිසරය ආරක්ෂා කිරීමේ උපාය මාර්ගයක් ලෙස, 'සූර්ය බල සංග්‍රාමය' ව්‍යාපෘතිය තවදුරටත් ප්‍රවර්ධනය කොට ආරක්ෂා කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— 'කළුතර මුහුදු වෙරළ කලාපය' විශේෂිත ආර්ථික කලාපයක් ලෙස ප්‍රවර්ධනය කිරීම,— කළුතර නගරය මුල් කරගත් සංචාරක කලාපයක් සංවර්ධනය කිරීම වෙනුවෙන් ද, කළු ගඟේ මෝය සහ මුහුදු වෙරළ ආරක්ෂා කිරීමේ උපාය මාර්ගයක් ලෙස ද, කැලිඩෝ මුහුදු වෙරළ සහ කළු ගඟේ මෝය වෙනස් වීම හේතුවෙන් අලුතින් බිහිවී ඇති ගොඩබිම ඇතුළත්, 'කළුතර මුහුදු වෙරළ කලාපය', විශේෂිත ආර්ථික කලාපයක් ලෙස ප්‍රවර්ධනය කොට සංවර්ධනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— 'මිල්ලනිය අපනයන සැකසුම් කලාපය' ඉදිකිරීම කඩිනම් කිරීම,— කළුතර දිස්ත්‍රික්කයේ, 'මිල්ලනිය අපනයන සැකසුම් කලාපය' (Millaniya Export Processing Zone) සඳහා අවශ්‍ය ඉඩම් අක්කර 240ක් දැනටමත් පවරා ගෙන ඇති හෙයින් ද, එම ව්‍යාපෘතිය සඳහා අධිවේගී මාර්ග පිවිසුම්, නළ ජලය සහ විදුලිය ලබා දීම සඳහා රජය විසින් රුපියල් බිලියනයකට ආසන්න මුදලක් දැනටමත් වැයකර ඇති හෙයින් ද, එම අපනයන සැකසුම් කලාපය සඳහා තෝරාගත් භූමිය එවැනි ව්‍යාපෘතියක් සඳහා සුදුසු බවට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දැනටමත් හඳුනාගෙන ඇති හෙයින් ද, එම අපනයන සැකසුම් කලාපය ඉදිකිරීම රජයේ ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස සලකා අවශ්‍ය ඉදිරි පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ඉංග්‍රීසි භාෂාවෙන් ද්විතියික අධ්‍යාපනය ලබාදීම ප්‍රවර්ධනය කිරීම,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18(3) ව්‍යවස්ථාව ප්‍රකාරව 'ඉංග්‍රීසි භාෂාව' ශ්‍රී ලංකාවේ සන්ධාන භාෂාව (Link Language) ලෙස පිළිගෙන ඇති හෙයින් ද, ජාත්‍යන්තර භාෂාවක් වන 'ඉංග්‍රීසි භාෂාව' පුරවැසියන්ට දැනුම ලබා ගැනීමේ ප්‍රධාන උපාය මාර්ගයක් ලෙස හඳුනාගෙන ඇති හෙයින් ද, ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ට භාෂා හෝ ජාති භේදයක් නොමැතිව එකම රටක ජීවත් වීම සඳහා අවශ්‍ය වන සන්ධාන භාෂාව ලෙස ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණතාවය ලබා ගැනීම ඉතා වැදගත් වන හෙයින් ද, නිදහස් අධ්‍යාපන සංකල්පය තුළ බිහි වූ ශ්‍රී ලංකාවේ මධ්‍ය මහා විද්‍යාල පද්ධතිය තුළ සහ තවත් පාසැල් ගණනාවක ඉංග්‍රීසි භාෂාවෙන් ද්විතීයික අධ්‍යාපනය ලබාදීමේ ක්‍රමවේදය සාර්ථක වී ඇති හෙයින් ද, ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ජාත්‍යන්තර රැකියා අවස්ථාවන් ලබා ගැනීම උදෙසා ඉංග්‍රීසි භාෂාවෙන් ලැබෙන අධ්‍යාපනය අතිශය වැදගත් වන හෙයින්

ද, ශ්‍රී ලංකාවේ සියලුම ද්විතියික පාසැල් වල (Secondary Schools) ඉංග්‍රීසි මාධ්‍යයෙන් (English Medium) අධ්‍යාපනය ලබා දිය යුතු යැයි ද, ඒ සඳහා ප්‍රමාණවත් ආයෝජනයක් සිදු කිරීම සඳහා රජය ප්‍රමුඛතාවය ලබා දිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා ඉංජිනේරු පීඨයක් ස්ථාපනය කිරීම,— ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළ තුළ අවශ්‍යතා සපුරාලන නවීන තාක්ෂණික උපාධිධාරින් පිරිසක් සපයන විශ්වවිද්‍යාලයක් වන හෙයින්, ශ්‍රී ලංකාවේ වර්ධනය වන ඉදිකිරීම්, කාර්මික, කර්මාන්ත සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රවල මෙන්ම ගෝලීය අවශ්‍යතාවන් ද සලකමින්, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා ඉංජිනේරු පීඨයක් ස්ථාපනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/2025

ගරු රෝහණ බංඩාර මහතා,— පිහිනුම් කුසලතාවය ඉහළ දැමීමේ වැඩසටහනක් සකස් කිරීම,— දියෙහි ගිලී මිය යන පුද්ගලයන්ගේ සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යන බව මෑත කාලීනව නිරීක්ෂණය වන හෙයින්, ඉතා උසස් වාරි ශිෂ්ඨාචාරයකට හිමිකම් කියන අතීත ජනතාව තුළ පැවති පිහිනුම් කුසලතාවය, වත්මන් පරපුර තුළ ද ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 106/2026

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා,— ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සඳහා වෛද්‍ය පීඨයක් ස්ථාපනය කිරීම,— ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය දේශීය හා විදේශීය රැකියා වෙළෙඳපොළ අවශ්‍යතා සපුරාලන නවීන තාක්ෂණික උපාධිධාරින් පිරිසක් සපයන විශ්වවිද්‍යාලයක් වන හෙයින්, ශ්‍රී ලංකාවේ වෛද්‍ය ක්ෂේත්‍රවල වර්ධනය වන අවශ්‍යතාවන් මෙන්ම ගෝලීය අවශ්‍යතාවන් සලකමින්, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සඳහා වෛද්‍ය පීඨයක් ස්ථාපනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/2026

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— දියගම වනාන්තරය ආරක්ෂා කිරීම,— දියගම වනාන්තරය කොළඹ තදාසන්නයේ ඉතිරිව ඇති අවසාන නාගරික පහත්බිම් වැසි වනාන්තරවලින් එකක් වන අතර නගරයට ආසන්නතම වැසි වනාන්තර කොටස වන හෙයින් ද; බොල්ගොඩ ගඟ පෝෂණය කරන එහි තෙත්බිම් සහ ඇළ දොළ හරහා ජල ප්‍රවාහය නියාමනය කිරීමෙන් ස්වාභාවික ගංවතුර අවරෝධකයක් ලෙස එය වැදගත් කාර්යභාරයක් ඉටු කරන හෙයින් ද, එමඟින් අවට ප්‍රජාවන් ගංවතුරෙන් ආරක්ෂා කෙරෙන හෙයින් ද; මෙම වනාන්තරය රතු උණහපුළුවා, දම් පැහැ මුහුණැති කොළ වඳුරා සහ හඳුන් දිවියා වැනි වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සත්ත්ව විශේෂ ඇතුළුව ශාක හා සත්ත්ව විශේෂ 220 කට අධික සංඛ්‍යාවකට නිවහන වන හෙයින් ද; ආසන්න වශයෙන් 12.6% ක් ආවේණික ශාක හා 11.58% ක් ආවේණික සත්ත්ව විශේෂ සඳහා රැකවරණය සලසන එකම තීරණාත්මක ජෛව විවිධත්ව කේන්ද්‍රස්ථානයක් වන හෙයින් ද, ඒවායිනුත් බොහොමයක් නාගරික ව්‍යාප්තිය නිසා වැඩි වැඩියෙන් තර්ජනයට ලක්ව ඇති හෙයින් ද; දියගම වනාන්තරය එහි උණහපුළු ගහනය සම්බන්ධයෙන් ජාත්‍යන්තරව පිළිගැනීමට ලක්ව

ඇති හෙයින් ද, විදේශීය සංචාරකයින් ආකර්ෂණය කර ගනිමින් තිරසර පාරිසරික සංචාරක ව්‍යාපාරය සඳහා ශක්තිමත් විභවයක් පවතින හෙයින් ද; ජෛව විවිධත්වය, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ ප්‍රජා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මෙම වනාන්තරයේ ආරක්ෂාව අත්‍යවශ්‍ය වන හෙයින් ද; දියගම වනාන්තරය අහිමි වීම නැවත යථා තත්ත්වයට පත් කළ නොහැකි තත්ත්වයක් වනු ඇති හෙයින් ද, එය අප්‍රමාදව සංරක්ෂණය කිරීම අනාගත පරම්පරාවන් සඳහා අත්‍යවශ්‍ය කටයුත්තක් වන බැවින් සහ ශ්‍රී ලංකාව එකඟ වී ඇති ජාතික හා ජාත්‍යන්තර සංරක්ෂණ එකඟතාවන් සම්පූර්ණ කිරීමක් වන හෙයින් ද; දියගම වනාන්තරය තුළ සිදු කෙරෙන සියලුම එළිපෙහෙළි කිරීම් සහ සංවර්ධන කටයුතු වහාම නතර කිරීමට, වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක පනත (FFPA) යටතේ ආරක්ෂිත ප්‍රදේශයක් ලෙස එය ගැසට් කිරීමට, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බලසීමාව යටතේ එය තැබීමට සහ අනාගත ආක්‍රමණ සහ තිරසර නොවන සංවර්ධනයට එරෙහිව හැකි තරම් ශක්තිමත් නීතිමය ආරක්ෂාව සහතික කිරීමට කඩිනමින් ක්‍රියා කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 109/2026

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම,— වසර 26 කට වැඩි කාලයක් පුරා පැවැති උතුරු නැගෙනහිර යුද්ධය නිසා සිදු වූ ජීවිත හානි, අතුරුදහන්වීම් සහ අනෙකුත් විනාශයන් සොයා බැලීම සඳහා ද, ජාතික සමඟිය ඇති කිරීම සහ ඒ වෙනුවෙන් ගත හැකි ඉදිරි පියවර සොයා බැලීම සඳහා ද වන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවක් (Truth Commission) ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 110/2026

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— වයස අවුරුදු 15ට අඩු ළමුන්ට සමාජ මාධ්‍ය භාවිතය සීමා කරන නීතිමය ක්‍රමවේදයක් හඳුන්වාදීම,— අධික සමාජ මාධ්‍ය භාවිතය හේතුවෙන් ළමුන් අතර මානසික පීඩනය සහ ආතතිය වැඩිවීම, අධ්‍යාපන කාර්ය සාධනය පහළ යාම, සයිබර් හිංසන (cyberbullying), අශෝභන හා අනාරක්ෂිත අන්තර්ගතයන්ට නිරාවරණය වීම වැනි ගැටලු වැඩිවෙමින් පවතින හෙයින් ද, ඕස්ට්‍රේලියාව, ප්‍රංශය හා ඩෙන්මාර්ක් වැනි දියුණු රටවල් මේ වනවිටත් ළමුන් සඳහා සමාජ මාධ්‍ය භාවිතය සීමා කිරීමට නීති හඳුන්වා දී තිබෙන හෙයින් ද, ළමුන්ගේ මානසික සෞඛ්‍යය, ආරක්ෂාව සහ අධ්‍යාපනමය වර්ධනය ආරක්ෂා කිරීම වෙනුවෙන් සමාජ මාධ්‍ය ගිණුම් විවෘත කිරීම සඳහා අවම වයස අවුරුදු 15 ලෙස නියම කිරීම, සමාජ මාධ්‍ය සමාගම් සඳහා වයස් සත්‍යාපන ක්‍රම අනිවාර්ය කිරීම, නීතිය උල්ලංඝනය කරන ආයතන සඳහා දඩ සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සහ වැඩිහිටියන්ගේ ගිණුම් භාවිතා කරමින් සමාජ මාධ්‍ය භාවිතා කරන දරුවන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම යන කරුණු ක්‍රියාවට නැංවීම සඳහා වයස අවුරුදු 15ට අඩු ළමුන්ට සමාජ මාධ්‍ය භාවිතය සීමා කරන නීතිමය ක්‍රමවේදයක් හඳුන්වාදීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 112/2026

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉවත් කිරීම,— ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මඟින් වසර 40 කට වැඩි කාලයක් තිස්සේ දිගු කාලීන අත්තනෝමතික රඳවා තබා ගැනීම්වලට ඉඩ සලසා ඇති හෙයින් ද, වධහිංසා මඟින් ව්‍යාජ පාපොච්චාරණ ලබා ගැනීම සඳහා සහ සුළු ජන කොට්ඨාස සහ සිවිල් සමාජ කණ්ඩායම්

ඉලක්ක කර ගැනීමට භාවිතා වී ඇති හෙයින් ද, අත්‍යවශ්‍යම මොහොතක දී හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමට හැකියාව පවතින හෙයින් ද, ත්‍රස්තවාදයට සම්බන්ධ වැරදි සඳහා දැනටමත් දණ්ඩ නීති සංග්‍රහය යටතේ නඩු පැවරීමට හැකියාව පවතින හෙයින් ද, පුළුල් බලතල සහිත ස්ථිර ත්‍රස්ත විරෝධී නීතියක් සඳහා කිසිදු සාධාරණීකරණයක් නොමැති බැවින් ද, ශ්‍රී ලංකා රජය විසින් 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, එම පනතට සමාන නීතිමය විධිවිධාන අඩංගු නීතියක් හඳුන්වා දීමකින් තොරව, සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම සඳහා වහාම පියවර ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 113/2026

ගරු සුජීව දිසානායක මහතා,— පරිවේණාචාර්යවරුන්ගේ විශ්‍රාම වැටුප සඳහා ඔවුන්ගේ වැටුපෙන් අමතර සියයට හයක මුදලක් අයකිරීම නතර කිරීම,— නූතන පාසල් අධ්‍යාපන රටාව මෙන්ම, සාම්ප්‍රදායික අධ්‍යාපන රටාව වූ පිරිවෙන් අධ්‍යාපනය, මෙරට ක්‍රියාත්මක වන ප්‍රධාන අධ්‍යාපන රටාවක් වන හෙයින් ද, නූතන පාසල් අධ්‍යාපන ක්‍රමයට, එහි ගුරුවරයන් හා සිසුන්හට ලැබෙන වරප්‍රසාද මෙන්ම පිළිගැනීම, පිරිවෙන් අධ්‍යාපනයට හෝ එහි ගුරුවරයන් හා ගිහි පැවිදි සිසුන් දෙපාර්ශ්වයටම එලෙසින්ම නොලැබෙන හෙයින් ද, පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රධානම භූමිකාව වන පරිවේණාචාර්යවරුන්ගේ විශ්‍රාම වැටුප සඳහා ඔවුන්ගේ වැටුපෙන් අමතර සියයට හයක මුදලක් අයකිරීම 2026 අප්‍රේල් මස 01 දින සිට නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 114/2026

ගරු රවී කරුණානායක මහතා, — ලෝක පරිසරය සුරැකීම, — ලෝක පරිසරය සුරැකීම කෙරෙහි ශ්‍රී ලංකාව වඩා වැඩි අවධානයක් යොමු කළ යුතු බවත්, විශේෂයෙන්ම ගෝලීය උණුසුම ඉහළ යාම වැළැක්වීම සඳහා පියවර ගත යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 115/2026

ගරු රවී කරුණානායක මහතා,— මූල්‍ය වංචාවන්ට හසු වූ තැන්පත්කරුවන්ගේ මුදල් ආපසු ගෙවීම,— ලියාපදිංචි මූල්‍ය සමාගම් තුළ මුදල් තැන්පත් කර මූල්‍ය වංචාවන්ට හසු වූ තැන්පත්කරුවන්ට එම මුදල් නැවත ගෙවීම සඳහා රජය විසින් පියවර ගනු ලැබිය යුතු බවත්, එකී සමාගම් තුළ මුදල් තැන්පත් කර වංචාවන්ට හසු වූ තැන්පත්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටින බැවින්, එකී සමාගම්වල භාරකාර ආයතනය වන ශ්‍රී ලංකා මහ බැංකුව මෙහිදී කාර්යක්ෂමව ක්‍රියා කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 116/2026

ගරු චමින්ද විජේසිරි මහතා,— රජයේ රෝහල් පද්ධතිය තුළ බාහිර රෝගී අංශවල පවතින තදබදය අවම කිරීමට වැඩසටහනක් සකස් කිරීම,— ලෝක සෞඛ්‍ය දර්ශකයේ අප රටෙහි ස්ථානය කුමක් වුව ද, රජයේ රෝහල්වල බාහිර රෝගී ප්‍රතිකාර ඒකකයන් හි පවතින දැඩි තදබදය පාලනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 117/2026

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අලි-මිනිස් ගැටුම බහුලව පවතින ප්‍රදේශවල මී මැසි පාලනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— සංඛ්‍යා දත්ත වාර්තාවලට අනුව අලි-මිනිස් ගැටුම ඉහළින්ම පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව මේ වනවිට පත්ව ඇති හෙයින් ද, ඒ හේතුවෙන් වාර්ෂිකව මිනිසුන් හා අලි ඇතුන් විශාල සංඛ්‍යාවකගේ ජීවිත අහිමි වන හෙයින් ද, දේපළ ඇතුළු භෞතික සම්පත් විනාශ වන හෙයින් ද, එම තත්ත්වය වැළැක්වීමේ නියමු ව්‍යාපෘතියක් ලෙස කෙන්යාව වැනි රටවල ක්‍රියාත්මක වන පරිදි, අලි-මිනිස් ගැටුම සිදුවන ප්‍රදේශවල මී මැසි පාලනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 119/2026

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ සෙසු දිස්ත්‍රික්කවල සේවය කරන යාපනය දිස්ත්‍රික්කයට අයත් ගුරුවරුන් සහ රාජ්‍ය නිලධාරින්ගේ යහපත පිණිස විධිමත් නවාතැන් පහසුකම් හෝ මහල් නිවාස ව්‍යාපෘති ඇති කිරීම,— යාපනය දිස්ත්‍රික්කයේ සිට කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කවලට අනුයුක්තව බොහෝ දුෂ්කරතා මධ්‍යයේ සේවය කරන රාජ්‍ය නිලධාරින්ගේ සහ ගුරුවරුන්ගේ ප්‍රවාහන අපහසුතා සහ නවාතැන් ගැටලුවලට ස්ථිර විසඳුමක් ලබාදීම සහ ඔවුන්ගේ සේවය කාර්යක්ෂමව ලබා ගැනීම සහතික කිරීම සඳහා, ඒ ඒ දිස්ත්‍රික්කයන්හි කේන්ද්‍රීය ප්‍රදේශයක හෝ උචිත ස්ථානයක සියලු පහසුකම්වලින් සමන්විත විධිමත් නවාතැන් පහසුකම් හෝ මහල් නිවාස ව්‍යාපෘති රජය විසින් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 120/2026

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— ශ්‍රී ලංකාවේ සාගර සම්පත් කාර්යක්ෂමව පරිහරණය කිරීමට සහ මුහුදු ආශ්‍රිත කර්මාන්ත වැඩි දියුණු කිරීමට මුලතිව් දිස්ත්‍රික්කය තුළ සාගර විශ්වවිද්‍යාලයක් (Ocean University) ස්ථාපනය කිරීම,— ශ්‍රී ලංකාව වටා ඇති ගැඹුරු මුහුදු සහ වෙරළාසන්න සාගර සම්පත් විද්‍යාත්මකව හා තාක්ෂණිකව මෙහෙයවීමට අවශ්‍ය මානව සම්පත නිර්මාණය කිරීම මඟින් රටේ ආර්ථිකය ශක්තිමත් කළ හැකි හෙයින්, උතුරු පළාතේ ඉහළ සාගර විභවතාවක් සහිත මුලතිව් දිස්ත්‍රික්කයේ ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය නවීකරණය කිරීමටත්, තරුණ තරුණියන්ට සාගර ඉංජිනේරු විද්‍යාව, සාගර ගවේෂණය සහ ජලජ සම්පත් කළමනාකරණය වැනි ක්ෂේත්‍රයන්හි උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීමටත්, සියලු පහසුකම්වලින් සමන්විත සාගර විශ්වවිද්‍යාලයක් මුලතිව් දිස්ත්‍රික්කය තුළ ස්ථාපනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 121/2026

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— යාපනය දිස්ත්‍රික්කයේ දූපත් ආශ්‍රිත ප්‍රදේශවල සහ වෙරළාසන්න ගම්මානවල පවතින දැඩි පානීය ජල හිඟයට ස්ථිර විසඳුමක් ලෙස මුහුදු ජලය පිරිපහදු කිරීමේ ව්‍යාපෘති (Desalination Plants) පුළුල් කිරීම,— යාපනය දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශවල භූගත ජලය, කිවුල් ජලය බවට පරිවර්තනය වෙමින් පවතින හෙයින් ද, විශේෂයෙන්ම වේලනෙයි සහ නාගදීපය වැනි දූපත් ප්‍රදේශවල ජනතාව පානීය ජලය ලබා ගැනීමේ දී දැඩි දුෂ්කරතාවලට මුහුණ දෙන හෙයින් ද, නාගදීපය වැනි ප්‍රදේශවල දැනටමත් පවතින ජල පිරිපහදු මධ්‍යස්ථානවල ධාරිතාව ඉහළ නැංවීමත්, කුරිකට්ටුවාන් හරහා නළ මාර්ගයෙන් ජලය සැපයීමේ ව්‍යාපෘතිය කඩිනම් කිරීමත් මඟින් ජනතාවගේ මූලික අවශ්‍යතාවයක් වන පිරිසිදු පානීය ජලය මෙම ප්‍රදේශවල ජනතාවට ද ලබා දීම සහතික කිරීම සඳහා  මුහුදු ජලය පිරිපහදු කිරීමේ ව්‍යාපෘති පුළුල් කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා රජය ප්‍රමුඛතාවය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 122/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ තරුණයින් අතර ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන මත්ද්‍රව්‍ය භාවිතය පාලනය කිරීම සඳහා විශේෂ කාර්ය සාධක බලකායක් පිහිටුවීම සහ නවීන පුනරුත්ථාපන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම,— උතුරු පළාතේ මෑතක සිට ඉහළ ගොස් ඇති මත්ද්‍රව්‍ය ජාවාරම හා මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් සමාජ පද්ධතිය බිඳවැටීම සහ පාසල් සිසුන්ගේ අනාගතයට බලපෑම් එල්ල වන හෙයින්, මත්ද්‍රව්‍ය බෙදාහැරීමේ ජාලය මැඩලීම සඳහා ආරක්ෂක අංශ සම්බන්ධීකරණය කර ගනිමින් විශේෂ වැටලීම් වැඩි කිරීම සඳහා විශේෂ කාර්ය සාධක බලකායක් පිහිටුවීමටත්, මත්ද්‍රව්‍යවලට ගොදුරු වූ තරුණයින් යහමඟට ගැනීම සඳහා උතුරු පළාත තුළ සියලු පහසුකම් සහිත රජයේ පුනරුත්ථාපන සහ උපදේශන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමටත් රජය විසින් පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 123/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ තල් සහ පොල් මූලික කරගත් අපනයන කර්මාන්තශාලා ස්ථාපනය කර රැකියා විරහිත උපාධිධාරීන් සඳහා රැකියා අවස්ථා නිර්මාණය කිරීම,— උතුරු පළාතේ බහුලව පවතින තල් සහ පොල් හුදෙක් අමුද්‍රව්‍ය ලෙස පමණක් භාවිතා නොකර, නවීන තාක්ෂණය භාවිතයෙන් අගය එකතු කළ නිෂ්පාදන නිපදවන අපනයන කර්මාන්තශාලා රාජ්‍ය හා පෞද්ගලික අංශවල සහභාගිත්වයෙන් දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවීමටත්, එමඟින් එම ප්‍රදේශවල රැකියා විරහිත තරුණ තරුණියන්ගේ සහ උපාධිධාරීන්ගේ ජීවනෝපාය මාර්ග සුරක්ෂිත කිරීමටත් රජය සැලසුම් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 124/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ ආරක්ෂක හමුදා භාරයේ ඇති මහජනතාවගේ ඉඩම් නිදහස් කිරීම සහ කෘෂිකාර්මික හා ධීවර කටයුතු සඳහා එම ඉඩම් පරිහරණය කිරීමට අවසර ලබාදීම,— යුද්ධයෙන් පසුව සිදුකෙරුණු නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ දී, මහජනතාවගේ ඉඩම් මෙතෙක් මුළුමනින්ම නිදහස් කර නොමැති හෙයින් ද, ඒ හේතුවෙන් ඔවුන්ගේ සාම්ප්‍රදායික කෘෂිකාර්මික කටයුතුවල සහ ධීවර කර්මාන්තයේ නිරතවීමේ අවස්ථා අහිමි වී ඇති හෙයින් ද, මෙතෙක් නිදහස් කර නොමැති මහජනතාවගේ ඉතිරි ඉඩම්, ජාතික ආරක්ෂාවට තර්ජනයක් නොවන පරිදි කඩිනමින් නිදහස් කිරීමටත්, මහජනතාවගේ ජීවනෝපාය මාර්ග යළි නගාසිටුවීම සඳහා කෘෂිකාර්මික හා ධීවර කටයුතු වෙනුවෙන් එම ඉඩම් පරිහරණය කිරීමට අවසර ලබාදීමටත් රජය විසින් පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 125/2026

ගරු නන්ද බණ්ඩාර මහතා,— කඳුකර ප්‍රදේශවල ආහාර බෝග වගා කිරීම,— 2025 නොවැම්බර් මස දී, ශ්‍රී ලංකාවට දැඩි බලපෑමක් ඇති වූ "දිට්වා සුළි කුණාටුව" හේතුවෙන් කෑගල්ල, මහනුවර, මාතලේ සහ බදුල්ල යන දිස්ත්‍රික්කවල කඳු ආශ්‍රිත ප්‍රදේශ බහුලව නායයෑමට ලක් වූ හෙයින් ද, දැනට ශ්‍රී ලංකාවේ බොහෝ දිස්ත්‍රික්කවල රිලවා, වඳුරා සහ දඬුලේනා වැනි වන සතුන්ගෙන් වගා හානි සිදුවන හෙයින් ද, මෙම සතුන්ගේ ආහාර වෙනුවෙන් සහ පරිසර සමතුලිතතාවය ආරක්ෂා කිරීම සඳහාත්, පාංශු ඛාදනය වළක්වා ගැනීම සඳහාත්, එකී නායයෑමට ලක් වූ කඳුකර ප්‍රදේශවල කොස්, අඹ, කොස්දෙල් සහ ඇටඹ වැනි ආහාර බෝග වගා කිරීම සඳහා පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 126/2026

ගරු ටී.කේ. ජයසුන්දර මහතා,— කිතුල් කර්මාන්තය නගා සිටුවීම,— ශ්‍රී ලංකාවේ කිතුල් මැදීමේ තාක්ෂණය යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුමයක් ලෙස නම් කිරීම මඟින් අප රට පිළිබඳව ලෝකය තුළ විශේෂ ගෞරවයක් හිමි වී ඇති හෙයින් ද, ගාල්ල, මාතර, කළුතර, මහනුවර, මාතලේ, නුවරඑළිය, රත්නපුරය, කෑගල්ල, බදුල්ල, ගම්පහ හා තවත් දිස්ත්‍රික්කවල, මෙම කර්මාන්තය අසීරු ලෙස රැකගනිමින් සාම්ප්‍රදායික කිතුල් ආශ්‍රිත කර්මාන්තකරුවන් දහස් ගණනක් මේ වනවිටත් එහි යෙදී සිටින හෙයින් ද, මෙම කර්මාන්තය නැඟී එන සංචාරක ව්‍යාපාරය සමඟ බද්ධ කිරීමටත්, නවීන තාක්ෂණය යොදා ගනිමින් සාමාන්‍ය ග්‍රාමීය ජනතාවගේ ආර්ථික සංවර්ධනය සඳහා වූ නව ප්‍රවේශයන් සකස් කිරීමටත් සහ කිතුල් කර්මාන්තයේ දීර්ඝ කාලීන සුරක්ෂිතභාවය තහවුරු කර ගැනීමටත් සුදුසු යාන්ත්‍රණයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

**2026 ජූලි 21 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

180/2024

ගරු රවී කරුණානායක මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර 05 තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ජනනය කරන ලද මුළු විදුලි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉදිරි වසර 15 සඳහා ප්‍රක්ෂේපිත විදුලි ජනනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) විදුලි ජනන ක්‍රම සහ පුනර්ජනනීය සහ තාප ප්‍රභවයන් මඟින් ජනනය කරන ලද ප්‍රමාණ සහ මණ්ඩලය විසින් ජනනය කරන ලද සහ පෞද්ගලික අංශයෙන් මිලදී ගන්නා ලද ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (i)හි සඳහන් පසුගිය වසර 05 සඳහා මුළු ස්ථායි සහ ස්ථායි නොවන ජනන ධාරිතාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත (iii)හි සඳහන් ඒකකයක මූල්‍ය පිරිවැය සහ ක්ෂයවීම් සංරචක ඇතුළුව මණ්ඩලය විසින් දරන ලද ජනනය කිරීමේ ඒකකයක් සඳහා පිරිවැය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) පසුගිය වසර 05 තුළ මුළු විදුලි පරිභෝජනය සහ ඉදිරි වසර 05 සඳහා ප්‍රක්ෂේපිත විදුලි පරිභෝජනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vii) පාරිභෝගිකයන්ගෙන් අය කරනු ලබන ඒකකයක ලාභය/අලාභය සහ එහි විකුණුම් මිලට ඇතුළත් බදු ප්‍රමාණය කවරේද;

(viii) ඉදිරි වසර 03 සඳහා අපේක්ෂිත මුළු ලාභය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ix) පසුගිය වසර 05 තුළ සාමාන්‍ය උපරිම සහ අවම විදුලි ඉල්ලුම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

194/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා මෙරටට කුකුල් මස් ආනයනය කර තිබේද;

(ii) එසේ නම්, එම කාලය තුළ ආනයනය කළ කුකුල් මස් ප්‍රමාණය සහ ඒ සඳහා වැය කළ මුදල් ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වෙළඳපොළ තුළ කුකුල් මස් මිල ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

234/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන බව 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ පොරොන්දුවී තිබේද;

(ii) එසේ නම්, එය අහෝසි කරන්නේද;

(iii) එය අහෝසි කරනු ලබන කාලවකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

325/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රෝහල්වල දෛනික මෙහෙයුම් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය තීරණාත්මක අයිතම 15ක් සහ අත්‍යවශ්‍ය ලෙස හඳුනාගත් අයිතම 354ක් සම්බන්ධයෙන් වර්තමාන තොග තත්ත්වය;

(ii) එම අයිතම අතරින් සම්පූර්ණයෙන් තොග අවසන්වී ඇති අයිතම සහ මාස 02කට පමණක් ප්‍රමාණවත් තොග පවතින අයිතම වෙන් වෙන් වශයෙන්;

(iii) සැපයුම්කරුවන්ට ගෙවිය යුතු දින 60, 90, 120 සහ 150 ඉක්මවා ඇති හිඟ ගෙවීම්;

(iv) දින 60 ඉක්මවා ඇති හිඟ ගෙවීම් එලෙස ප්‍රමාද වීමට හේතු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදුලිය, ජලය, ආහාර සහ රෙදි සේදීම සඳහා ගෙවීම්වල වර්තමාන තත්ත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දේශීය නිෂ්පාදන සැපයුම්කරුවන්ට හිඟව පවතින, දින 60 ඉක්මවා ප්‍රමාදවී ඇති ගෙවීම් නිරවුල් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

553/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ජනතා විමුක්ති පෙරමුණේ ආරම්භක නායක රෝහණ විජේවීර මහතාගේ බිරිඳගේ සහ දරුවන්ගේ නම් කවරේද;

(ii) රෝහණ විජේවීර මහතාගේ ඝාතනයෙන් පසු මේ දක්වා ඔවුන් ජීවත්වූ එක් එක් ස්ථානය සහ එම එක් එක් ස්ථානයේ ජීවත්වූ කාල සීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන්ගේ නඩත්තු වියදම් ශ්‍රී ලංකාවේ රජය විසින් දරා තිබේ නම්, ඒ සඳහා දරන ලද වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඔවුන්ගේ නඩත්තු කටයුතු වෙනත් පුද්ගලයෙක් හෝ පුද්ගල කණ්ඩායමක් විසින් දරා තිබේ නම්, නඩත්තු කරන ලද කාල සීමාව සහ ඒ සඳහා දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඔවුන්ගේ නඩත්තු කටයුතු සඳහා විදේශ රටවලින් ආධාර ලැබී තිබේද;

(vi) එසේ නම්, ආධාර ලබා දුන් රට, පුද්ගලයන් සහ ආධාර ලබා දුන් කාල සීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

830/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රට පුරා ස්ථාපිත ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරවුම්හල් පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) ඛනිජ තෙල් බෙදුම්කරුවන්ට මේ වනවිට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලබා දෙන කොමිස් මුදල කොපමණද;

(iv) එම කොමිස් මුදල වෙනස් කිරීමට රජය තීරණය කොට තිබේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1633/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දැනට ලියාපදිංචිවී ගව පාලනයේ නියැලෙන කිරි ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගොවීන් සතුව සිටින ගවයන් සංඛ්‍යාව ආසන්න වශයෙන් කොපමණද;

(iii) එම ගවයන්ගේ ආහාරය සඳහා තණ කැපීමට ගොවීන්ට ලබාදී ඇති තණ බිම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1962/2026

ගරු අජිත් ගිහාන් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2020 සිට 2025 දක්වා වාර්ෂික පොල් නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සීමාසහිත හලාවත වැවිලි සමාගමේ පොල් නිෂ්පාදනය ඉහත කාල සීමාව තුළ සාපේක්ෂව වර්ධනයවී තිබේද;

(iii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iv) මෙරට ආර්ථිකයට දායකත්වයක් ලබා දෙන පොල් ආශ්‍රිත කර්මාන්ත නගාසිටුවීම සඳහා අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

(v) පොල් වගාවට කෘමීන්ගෙන් සිදුවන හානිය වැළැක්වීම සඳහා නව වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2060/2026

ගරු කංචන වැලිපිටිය මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ, කොටියාකුඹුර ප්‍රදේශයේ දෙදහසකට අධික ජනතාවක් උග්‍ර පානීය ජල ගැටලුවකින් පීඩා විඳින බව දන්නේද;

(ii) 2023 වර්ෂයේ සිට එම ගැටලුව විසඳීම සඳහා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනා 02 කවරේද;

(iii) එම යෝජිත ව්‍යාපෘති අනුමත කර, ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් කොටියාකුඹුර ප්‍රදේශයේ ජල ගැටලුවට විසඳුමක් ලැබෙන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2085/2026

ගරු රුවන් මාපලගම මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට අයත් හජ් අරමුදලේ මේ වනවිට පවතින ශේෂය කොපමණද;

(ii) එම අරමුදලට මුදල් බැර වන ආකාරය කවරේද;

(iii) එම අරමුදලේ මුදල් භාවිතා කරමින් ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව සහ ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතිවල ප්‍රගතිය සහ ප්‍රතිඵල පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) අරමුදල වාර්ෂිකව විගණනයට ලක් කරන්නේද;

(vi) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 ජූලි 22 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

746/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාව හැර ගොස් සිටින නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) නීතිපති දෙපාර්තමේන්තුවේ විශේෂ දක්ෂතා ඇති නිලධාරීන් මේ වනවිට හිඟ වීමෙන් එක් නිලධාරියෙකු විසින් ලිපි ගොනු 200-300ක් පමණ හසුරුවන බව දන්නේද;

(iii) ඒ හේතුවෙන් ඇතිවී තිබෙන ප්‍රමාදය අවම කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) නීතිපති දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

885/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජය විසින් පිරිනමනු ලබන 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' නොමැතිව මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළේපත්තුව, වාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පුද්ගලයන් පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයින්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම රජයේ ඉඩම්වලින් ඉහත පුද්ගලයන් නිත්‍යානුකූලව ඉවත්කිරීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඔවුන්ට එරෙහිව අධිකරණයේ නඩු පවරා තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(v) අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු පැවරූ පුද්ගලයන් අතරින් ඉහත කාලසීමාවේදී අධිකරණ නියෝග මත රජයේ ඉඩම්වලින් ඉවත්කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(vi) නඩු පැවරිය යුතු එහෙත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු නොපවරන ලද පුද්ගලයන් සිටීද;

(vii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(viii) කිහිපදෙනෙකුට එරෙහිව පමණක් නඩු පැවරීමටත්, වැඩි පිරිසකට එරෙහිව නඩු නොපැවරීමටත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

908/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පදනම ආයතනය පිහිටුවීමේ අරමුණු කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම ආයතනයට රජය මඟින් ලබා දුන් ප්‍රතිපාදන එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට මෙම ආයතනය, එහි ආරම්භක අරමුණුවලින් බැහැරවී, මුදල් උපයන ආයතනයක් බවට පත්වී තිබෙන බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

944/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට විදේශ රැකියාවල නිරත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සංඛ්‍යාව එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ශ්‍රමිකයින් අතරින්, අදාළ රටවල ක්‍රියාත්මක සමාජ ආරක්ෂණ ක්‍රමවේදවලට දායක වන පිරිස කොපමණද;

(iii) ඔවුන් සේවා කාලය නිමකර මෙරටට ආපසු පැමිණීමේදී, එම මුදල් නැවත ලබා ගැනීම පිළිබඳව ගැටලු මතුවී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, එම ගැටලු විසඳීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1020/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංවර්ධන නිලධාරින් සඳහා අනුමත සේවා ව්‍යවස්ථා නොමැතිකම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අංශය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන පියවර කවරේද;

(ii) උපාධි සුදුසුකම් සහිතව සේවයට ඇතුළත්වූ සංවර්ධන නිලධාරින්ට (MN 4) පවරා ඇති මූලික කාර්යභාරය සහ වගකීම් කවරේද;

(iii) උසස් පෙළ සුදුසුකම් සහිතව සේවයට ඇතුළත්වූ කළමනාකරණ සේවා නිලධාරින්ට (MN 3) පවරා ඇති නිශ්චිත රාජකාරි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1034/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නවක වද සිදුවීම් හේතුවෙන් මියගිය සහ තුවාල ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව එක් එක් විශ්වවිද්‍යාලය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම සිදුවීම් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල මට්ටමින් පත් කරන ලද කමිටු සංඛ්‍යාව කොපමණද;

(iii) එම කමිටු වාර්තාවලට අනුව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ක්‍රියාත්මක වන අමානුෂික නවක වදය වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1268/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නාවලඩිවට්ටෛ ප්‍රදේශයේ 1986,1989,1991 සහ 1997 වර්ෂවල එම දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් ඉඩම් කච්චේරියක් පවත්වා, ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය මත අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ගොවීන් 21කට බලපත්‍ර ලබාදී ඇති බව දන්නේද;

(ii) පසුගිය වර්ෂ 30 මුළුල්ලේ කෘෂිකාර්මික හා ගොඩ ඉඩම් වගා කටයුතුවල නිරතවූ ගොවීන් 21 දෙනෙකුට, අම්පාර දිසාපතිවරයාගේ නියෝග අනුව ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එම ඉඩම්වල කෘෂිකාර්මික කටයුතු නොකරන ලෙස දන්වා වරින් වර බාධා කර ඇති බව දන්නේද;

(iii) එම ගොවීන්ට අයත් ඉඩම් හඳුනාගෙන නැවත භාරදීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා සහ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරින් ඇතුළු කණ්ඩායමක් අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් පත්කර එම ප්‍රදේශයට යවා ඇති අතර, එම ඉඩම් භාරදීම වැළැක්වීම සඳහා පිරිසක් බාධා කර ඇති බව දන්නේද;

(iv) එම ඉඩම් අදාළ ගොවීන්ට නැවත ලබා දීමට පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1280/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථවල වායු විමෝචන පරීක්ෂණ සිදු කිරීම සඳහා මණ්ඩලයේ ඩිපෝවල වායු විමෝචන පරීක්ෂණ ආයතන පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, එම ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා පිහිටුවා ඇති ඩිපෝ කවරේද;

(iv) එම වායු විමෝචන පරීක්ෂණ ආයතන පිහිටුවීම සඳහා වැය කර ඇති මුළු මුදල කොපමණද;

(v) මේ වනවිට එම වායු විමෝචන පරීක්ෂණ ආයතනවලින් සේවා සපයන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1376/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මඟින් මහනුවර දිස්ත්‍රික්කය තුළ මගී ප්‍රවාහනය සිදු කළ යුතු මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම මාර්ග අතරින් මණ්ඩලයේ බස්රථ මඟින් මගී ප්‍රවාහනය සිදු කරනු ලබන මාර්ග සංඛ්‍යාව සහ මගී ප්‍රවාහනය සිදු කරනු නොලබන මාර්ග සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මගී ප්‍රවාහනය සිදු කරනු නොලබන මාර්ගවල එම මණ්ඩලයේ බස්රථ මඟින් මගී ප්‍රවාහනය සිදු නොකිරීමට හේතු කවරේද;

(iv) මහනුවර දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ ධාවනය ඉහළ නැංවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) මහනුවර දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ සංවර්ධනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1770/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) තේ වගාව සඳහා පොහොර සහනාධාරය ලබාදීමේදී හඳුන්වා දුන් QR කේත ක්‍රමය මඟින් අපේක්ෂිත අරමුණු සපුරාගෙන තිබේද;

(ii) එසේ නම්, එම සාර්ථකත්වය තහවුරු කරන දත්ත කවරේද;

(iii) දැනට පවතින එම QR කේත යෝජනා ක්‍රමයේ ප්‍රායෝගික ගැටලු කවරේද;

(iv) මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී අපේක්ෂිත ඉලක්ක සපුරා නොගත් අවස්ථා තිබේද;

(v) එසේ නම්, එයට හේතුවූ මූලික සාධක කවරේද;

(vi) පොහොර ලබා ගැනීමේදී QR කේත ක්‍රමය හේතුවෙන් පීඩාවට පත්වූ තේ වැවිලිකරුවන් සඳහා රජය මඟින් ලබාදී ඇති විකල්ප පහසුකම් හෝ සහන කවරේද;

(vii) QR කේත ක්‍රමය වැඩි දියුණු කිරීම හෝ වඩාත් ඵලදායි ක්‍රමයක් කරා යොමු කිරීම සඳහා ඉදිරියේදී රජය මඟින් ගනු ලබන ක්ෂණික ක්‍රියාමාර්ග තිබේද;

(viii) එසේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 ජූලි 23 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1190/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චි නගරය මධ්‍යයේ පිහිටි මහජන ක්‍රීඩාංගනය 2010 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර ඇති අතර, අද වනතුරු එම ක්‍රීඩාංගනය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ භාවිතය සඳහා පවරාදී නොමැති බව දන්නේද;

(ii) එම ක්‍රීඩාංගනය කවර මට්ටමේ ක්‍රීඩාංගනයක් ලෙස ඉදිකිරීමට සැලසුම් කර තිබේද;

(iii) මේ දක්වා මෙම ක්‍රීඩාංගනයේ ඉදිකිරීම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iv) පසුගිය වසර 10 තුළ එම ප්‍රතිපාදනවලින් වැය කර ඇති ප්‍රමාණය කොපමණද;

(v) එම ක්‍රීඩාංගනයේ ඉදිකිරීම් සඳහා මෙතෙක් ගිවිසුම් ගතවී ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(vi) වර්තමානයේ ඉදිකිරීම් සිදුකරන කොන්ත්‍රාත්කරුවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් එම දිස්ත්‍රික්කයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඇතිවී තිබෙන බලපෑම කවරේද;

(ii) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1526/2025

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංචාරක ආකර්ෂණ රැසකින් සමන්විත මුලතිව් දිස්ත්‍රික්කය සංචාරක කර්මාන්තය අතින් ඌන සංවර්ධිත දිස්ත්‍රික්කයක් ලෙස පවතින බව දන්නේද;

(ii) දේශීය සහ විදේශීය සංචාරක පැමිණීම ප්‍රවර්ධනය කිරීම පිණිස මුලතිව් දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති කවරේද;

(iii) සංචාරකයින්ගේ ආකර්ෂණය දිනා ගැනීම සඳහා මාර්ග, නවාතැන් පහසුකම්, සංචාරක නිකේතන සහ නැරඹුම් මධ්‍යස්ථාන ඇතුළු මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ සැලසුම් කවරේද;

(iv) එම දිස්ත්‍රික්කයේ සංචාරක ක්ෂේත්‍රය තුළ පෞද්ගලික අංශයේ ආයෝජන දිරිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) මුලතිව් දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් සංචාරක මඟපෙන්වන්නන් ලෙස, පරිසර සංචාරක පහසුකම් සලසන්නන් ලෙස හෝ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ වෘත්තිකයන් ලෙස පුහුණු කර සේවයේ යෙදවීමේ කිසියම් සැලසුමක් තිබේද;

(vi) මුලතිව් දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රදේශ කිහිපයක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ විශේෂ සංචාරක කලාප ලෙස ප්‍රකාශයට පත් කිරීම පිළිබඳව සලකා බලන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1548/2025

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පූනුගල සිට වේවැල්තලාව (වැවියතලාව) දක්වාවූ මාර්ගයේ දිග කිලෝමීටර්වලින් කොපමණද;

(ii) වාහන ධාවනය කිරීමට පමණක් නොව, පා ගමනින් යැමට පවා නොහැකි දුෂ්කර තත්ත්වයක එම මාර්ගය පවතින බව දන්නේද;

(iii) එම මාර්ගයේ පූනුගල සිට වේවැල්තලාව දක්වා කොටස පිළිසකර කිරීම සිදු නොකර ඇත්තේ කවර වර්ෂයක සිටද;

(iv) ඉහත මාර්ගය පිළිසකර නොකිරීම, වේවැල්තලාව වතුයායේ පදිංචිකරුවන්ගේ දෛනික කටයුතු සිදු කර ගැනීමට බාධාවක් බව පිළිගන්නේද;

(v) එම මාර්ගය පිළිසකර කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(vi) ඉහත මාර්ගය පිළිසකර කිරීමේදී, අදාළ වතු සමාගම සහ රජය අතර පවතින එකඟතාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1644/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රජයේ පාසල් සඳහා අනුමත ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුරුවරුන් සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට එම දිස්ත්‍රික්කයේ සේවයේ යෙදී සිටින ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට තිබෙන ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1657/2025

ගරු චානක මාදුගොඩ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය කුරුඳු සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන් ස්ථානගත කර ඇති දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම දෙපාර්තමේන්තුවේ සහ ප්‍රාදේශීය කාර්යාලවල සංවිධාන ව්‍යුහය කවරේද;

(iv) එම දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තු පනතක් මඟින් ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබේද;

(v) දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව සඳහා අවශ්‍ය මානව සම්පත් ප්‍රමාණවත් ලෙස තිබේද;

(vi) නොඑසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1756/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන්ට ඉඩම් ලබාදීම සහ එම ඉඩම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා 2008/4 චක්‍රලේඛය ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එසේ නම්, එම චක්‍රලේඛය යටතේ පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අදියර 1,2,3,4 සහ 5 යටතේ අයදුම් කළ තැනැත්තන්ගේ සංඛ්‍යාව සහ නිකුත් කර ඇති නව ඉඩම් බලපත්‍ර සංඛ්‍යාව අදියර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත චක්‍රලේඛයට අනුව පසුගිය වසර 17ක කාලය තුළ පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් නිකුත් කර ඇති මුළු නව බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iv) එම චක්‍රලේඛය යටතේ අයදුම් කර ඇති, එහෙත් මෙතෙක් නිකුත් කර නොමැති ඉඩම් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(v) නැගෙනහිර පළාත් ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යොමු කර ඇති නමුත්, මෙතෙක් නිකුත් කර නොමැති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(vi) එම ඉඩම් බලපත්‍ර නිකුත් නොකර රඳවා තබා ගැනීමට බලපා ඇති හේතු කවරේද;

(vii) අදාළ බලපත්‍ර සුදුස්සන්ට ඉතා කඩිනමින් නිකුත් කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1790/2025

ගරු බී. ආරියවංශ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති දෙමළ මාධ්‍ය පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වල ඇති ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම පුරප්පාඩු පිරවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1824/2026

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මත්පැන් සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම සඳහා උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පුනරුත්ථාපන මධ්‍යස්ථාන ස්ථාපිත කර තිබේද;

(ii) එසේ නම්, ඒවා ස්ථාපිත කර ඇති දිස්ත්‍රික්ක කවරේද;

(iii) වර්තමානයේදී එම මධ්‍යස්ථානවලින් සේවා සපයනු ලබන්නේද;

(iv) එසේ නම්, සේවා සපයනු ලබන දිස්ත්‍රික්ක කවරේද;

(v) නොඑසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(vi) එම මධ්‍යස්ථාන ක්‍රියාත්මක තත්ත්වයට පත්කිරීම සඳහා අපේක්ෂිත කාලවකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1990/2026

ගරු තිළිණ සමරකෝන් මහතා,— වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උත්සව සමයේදී ප්‍රමාණවත් සහල් තොග වෙළඳපොළට නිකුත් කිරීමට හැකියාවක් තිබේද;

(ii) සියලුම සහල් වර්ගවල පාලන මිල, සහල් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) සීමාසහිත ලංකා සතොස මඟින් සහල් බෙදාහැරීමට සකසා ඇති වැඩපිළිවෙළ කවරේද;

(iv) ආනයනික සහල් වර්ග කවරේද;

(v) එම සහල්වල වර්තමාන මිල, සහල් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය රට තුළ ප්‍රමාණවත් පරිදි ගබඩා කර තිබේද;

(ii) එම ආහාර ද්‍රව්‍ය පෞද්ගලික අංශය මඟින් පමණක් ආනයනය කරනු ලබන්නේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා රාජ්‍ය අංශය මැදිහත් වන ආකාරය කවරේද;

(iv) සහල් සහ අනෙකුත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල පාලනය කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ප්‍රමාණවත් ලෙස මැදිහත් වන්නේද;

(v) එම අධිකාරිය මිල පාලනය සඳහා මැදිහත් වන ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2092/2026

ගරු සුනිල් රාජපක්ෂ මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටුවන ලද 'ගැමිදිරිය' සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්තමානයේ සක්‍රිය සමාගම් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට සක්‍රිය සහ අක්‍රිය සමාගම්වල නිශ්චල, චංචල හා මූල්‍ය වත්කම්වල භාරකාරත්වය දරන්නේ කවුරුන්ද;

(iv) එම සමාගම්වල වත්කම් හා ගනුදෙනු වාර්ෂිකව විගණනය කරන්නේද;

(v) එසේ නම්, එම විගණන බලධරයා කවුරුන්ද;

(vi) එම සමාගම් නිලධාරින්ගේ අක්‍රමිකතාවලට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 ජූලි 24 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

29/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිරිපිටි ආනයනය කිරීම සඳහා විශාල මුදලක් වැයවන බවත්;

(ii) කිරි ගොවීන් නගා සිටුවීම මඟින් විශාල ආර්ථික වාසියක් මෙන්ම ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීමට හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දෛනික කිරි අවශ්‍යතාවයෙන් අප රට තුළ නිපදවනු ලබන කිරි ප්‍රමාණය කොපමණද;

(ii) කිරි ගොවීන් නගා සිටුවීමට හා දිරිමත් කිරීමට රජය විසින් යම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

120/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) චීනයේ කාබනික පොහොර ආනයනය කිරීම සම්බන්ධයෙන් විගණන වාර්තාවක් නිකුත් කර තිබෙන බව දන්නේද;

(ii) එම විගණන වාර්තාව අනුව චීනයේ කාබනික පොහොර ආනයනය කිරීම හේතුවෙන් සිදුවී ඇති මූල්‍යමය අලාභය කොපමණද;

(iii) එම විගණන වාර්තාව මඟින් ලබාදී ඇති නිර්දේශ කවරේද;

(iv) එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

658/2025

ගරු රෝහණ බණ්ඩාර මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇලයාපත්තුව ප්‍රදේශයේ උළු කර්මාන්තශාලාවක් තිබෙන බවත්;

(ii) මේ වනවිට එම උළු කර්මාන්තශාලාව අක්‍රිය තත්ත්වයේ පවතින බවත්;

(iii) ඒ හේතුවෙන්, එම කර්මාන්තශාලාවේ වටිනා යන්ත්‍රෝපකරණ දිරාපත් වෙමින් තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම කර්මාන්තශාලාව නැවත ආරම්භ කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1413/2025

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නව තැපැල් කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මෙම වර්ෂයට අදාළව අයවැයෙන් වෙන්කර ඇති මුදල කොපමණද;

(ii) කිරාන් තැපැල් කාර්යාලය පෞද්ගලික ගොඩනැගිල්ලක ක්‍රියාත්මක වන බව දන්නේද;

(iii) කිරාන් තැපැල් කාර්යාලය සඳහා නව තැපැල් කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඒරාවූර්පත්තු වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මාවඩිවේම්බු ප්‍රදේශයේ තැපැල් කාර්යාලයක් නොමැති වීමෙන් වැඩිහිටියන් සහ වැන්දඹු කාන්තාවන් චිත්තාන්ඩි උප තැපැල් කාර්යාලයෙන් ඔවුන්ගේ දීමනා ලබා ගන්නා බව දන්නේද;

(ii) මාවඩිවේම්බු ප්‍රදේශයේ නව තැපැල් කාර්යාලයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන්නේද;

(iii) උප තැපැල් කාර්යාලයක් තැපැල් කාර්යාලයක් බවට උත්ශ්‍රේණිගත කිරීමට අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1889/2026

ගරු අබූබකර් අතම්බාවා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ, නාගරික ප්‍රදේශවලින් බැහැරව පිහිටි ජාතික පාසල්වල විදුහල්පති පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පවතින බැවින්, පරිපාලන හා අධ්‍යාපනික කටයුතුවලදී ගැටලු මතුවී ඇති බවත්;

(ii) අම්පාර දිස්ත්‍රික්කයේ ඇතැම් වෙරළබඩ අධ්‍යාපන කලාපවල සුදුසුකම්ලත් විදුහල්පතිවරුන් අතිරික්තව සිටියදී විදුහල්පතිවරුන් පත් නොකළ පාසල් බොහෝමයක් පවතින බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට (SLEAS) නව නිලධාරින්ගේ අවශ්‍යතාවය පවතින අවස්ථාවක, පවතින විදුහල්පති පුරප්පාඩු පිරවීම සඳහා එම සේවයේ නිලධාරින් කැඳවීමේ අවශ්‍යතාවය කවරේද;

(ii) එම නිලධාරින්ට ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතු කෙරෙහි අවධානය යොමු කිරීමට හැකිවනු පිණිස විදුහල්පති රාජකාරිවලින් නිදහස් කිරීමට හැකියාවක් තිබේද;

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සහ විදුහල්පති සේවයේ නිලධාරින්ගේ රැකියා අවස්ථා සමාන පදනමක් මත විධිමත් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) සුදුසුකම්ලත් විදුහල්පතිවරුන් ප්‍රමාදයකින් තොරව පාසල් පරිපාලනයට පත් කිරීම සහතික කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1980/2026

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආබාධිත තැනැත්තන් භාවිතයට ගන්නා 'ආධාරක උපකරණ' ආනයන බද්දෙන් නිදහස් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, නිදහස් කර ඇති ප්‍රතිශතය කවරේද;

(iii) නිදහස් කොට ඇති බදු වර්ග සහ උපකරණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෞද්ගලික පරිහරණය සඳහා ආබාධිතභාවයට ගැලපෙන පරිදි නිෂ්පාදනය කර ඇති රථ වාහන ආනයනය කිරීමේදී බදු සහන ලබාදීමට හැකියාව තිබේද;

(ii) එසේ නම්, බදු සහන ලබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් පවතින නීතිමය පසුබිම සහ චක්‍රලේඛ කවරේද;

(iv) පවතින චක්‍රලේඛ සහ නීති රාමුව තුළ ආධාරක උපකරණ හෝ රථ වාහන ආනයනයේදී බාධා පවතින්නේ නම්, එම නීති සංශෝධනය කිරීමට පියවර ගන්නේද;

(v) ආබාධිත තැනැත්තන්ට පෞද්ගලිකව හෝ ඔවුන්ගේ සංවිධානවලට විදේශීය පරිත්‍යාග ලෙස ලැබෙන ආධාරක උපකරණ සහ යෝග්‍ය රථ වාහන ආනයන බද්දෙන් නිදහස් කර තිබේද;

(vi) පරිත්‍යාග ලෙස ලැබෙන භාවිතා කරන ලද උපකරණ හා රථ වාහන සඳහා බදු සහනයක් ලබා දීමේ හැකියාවක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2061/2026

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය නිලධාරින්ගේ හැකියාවන්, කුසලතා සහ ආකල්ප වර්ධනය සඳහා විදේශීය පුහුණු අවස්ථා වැදගත් බව පිළිගන්නේද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා විදේශීය පුහුණු අවස්ථා සඳහා සහභාගිවූ රාජ්‍ය නිලධාරින් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ එම පුහුණුවීම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම විදේශීය පුහුණු අවස්ථා සියලු රාජ්‍ය සේවකයන් අතර සාධාරණ ලෙස බෙදී යන පරිදි ලබාදීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2093/2026

ගරු දේවානන්ද සුරවීර මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025 වර්ෂයේ සිට මේ දක්වා මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් කොළඹ දිස්ත්‍රික්කය තුළ පොලිස් භාරයේ සිටින වයස අවුරුදු 18ට අඩු ළමයින් සංඛ්‍යාව කොපමණද;

(ii) මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූ ළමයින් පුනරුත්ථාපනය කිරීමේ ක්‍රමවේදයක් තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(iv) මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවූ ළමයින් පුනරුත්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(v) එම ආයතනවල නම් කවරේද;

(vi) මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවූ ළමයින් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, පුනරුත්ථාපන ආයතන වෙත යොමු කරන තෙක් දිගු කාලයක් ළමා රැඳවුම් මධ්‍යස්ථානවල රඳවා තබන බව දන්නේද;

(vii) එසේ නම්, ඔවුන් කඩිනමින් පුනරුත්ථාපනය කිරීම සඳහා යොමු කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2095/2026

ගරු රුවන් මාපලගම මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පළාත් සභා නවයේ සභාපති ධුර දරන මහජන නියෝජිතයන්ගේ වරප්‍රසාද එක් එක් පළාත් සභාව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පළාත් සභා සභාපති ධුරය පළාත් සභා විසුරුවා හැරීමෙන් පසුව අහෝසි නොවීමට හේතු කවරේද;

(iii) එම තනතුර සඳහා වන වරප්‍රසාද සහ වැය වන රාජ්‍ය වියදම් සැලකිල්ලට ගෙන, පළාත් සභා විසුරුවා හරිනු ලැබූ විටම තනතුරද අහෝසි කිරීමේ හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2101/2026

ගරු සුජීව දිසානායක මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති රියදුරු පුහුණු පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) රාජ්‍ය මැදිහත්වීමෙන් ක්‍රියාත්මක වන රියදුරු අභ්‍යාස ආයතන තිබේද;

(iii) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මඟින් ක්‍රියාත්මක වන රියදුරු පාසල් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ තිබෙන පෞද්ගලික හා රාජ්‍ය මැදිහත් වීමෙන් ක්‍රියාත්මක වන රියදුරු පුහුණු ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) පොතුහැර ප්‍රදේශයේ මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන රියදුරු පුහුණු ආයතනයක් පිහිටා තිබේද;

(iii) එම ආයතනය විසින් පසුගිය වසර 05 තුළ උපයා ඇති ආදායම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?